www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයට එරෙහිව මාක්ස්වාදය
The Frankfurt School vs. Marxism,

# ඇලෙක්ස් ස්ටයිනර්ගේ දේශපාලන හා බුද්ධිමය චාරිකාව - දෙවන කොටස

## The political and Intellectual Odyssey of Alex Steiner - Part 2

ඩේවිඩ් නෝර්ත් විසිනි
2008 ඔක්තෝබර් 23

### (iv) ඇලෙක්ස් ස්ටයිනර් හා සමාජවාදී සමානතා පක්ෂය

1978 ශරත් සමයේ වර්කර්ස් ලීගය සිය දේශපාලන මූලස්ථානය නිව් යෝර්ක් හි සිට ඩෙට්රොයිට් වෙත ගෙන යාමට කටයුතු කරමින් සිටිය දී, කිසිදු හේතු දැක්වීමකින් තොරව ඇලෙක්ස් ස්ටයිනර් පක්ෂය හැර ගියේය. ඊට ප්‍රථම 1973 වසරේ වර්කර්ස් ලීගයේ ජාතික ලේකම් ටිම් වුල්ෆර්ත්ගේ ඉල්ලා අස්වීමෙන් කුලුගැන්වුනු පක්ෂයේ දේශපාලන අර්බුදය හමුවේ ස්ටයිනර් ව්‍යාපාරයෙන් සමුගත්තේ ය. ඔහු පක්ෂයට යලි සම්බන්ධ වූයේ 1974 ග්‍රීෂ්මයේ ය. එහෙත් 1978 ඔහුගේ දෙවන සමුගැනීමෙන් විප්ලවවාදී ව්‍යාපාරය තුල ඔහුගේ ක්‍රියාකලාපය අවසානයකට පත්විය. ඔහුගේ වෙන්වීමට ප්‍රථම මා සමඟ පැවැත්වූ ඔහුගේ අවසන් සාකච්ඡාවේදී "ජීවිතය බෙහෙවින් අඳුරු" යයි ඔහු පැවසීය. මා නිතරම මෙම වචන සිහිපත් කලේ හුදෙක් යමෙකුගේ පුද්ගලික දූර්මුඛභාවය ඉන් මූර්තිමත් කල නිසා පමනක් නොව, සුලු ධනපති රැඩිකල් බුද්ධිමතුන් පුලුල් ස්ථරයකගේ අශුභවාදයත් දිරිසුන් භාවයත් ඉන් නිරූපනය වූ බැවින්ය. එසේ වුවත් ස්ටයිනර් වර්කර්ස් ලීගයෙන් වෙන්වී යාම පිලිබඳව මම කනස්සල්ලට පත් වුනෙමි. විශේෂයෙන්ම 1974 ඔහු වර්කර්ස් ලීගයට යලි එක්වීමෙන් පසුව අප බොහෝ න්‍යායික ව්‍යාපෘතීන්හි එකට වැඩ කලෙමු. කෙසේ වුවත් ඔහුගේ ආවේගශීලී කැලඹීම් ස්වභාවය ද, ගැටලු සමඟ පොරබැදීමේ දී අධෛර්යයට පත්වීමේ නැඹුරුව හා ජීවිතය පිලිබඳ අශුභවාදී දෘෂ්ටිය ස්ටයිනර්ගේ බුද්ධිමය හැකියාවන්ට හරස් විය.

1985 දී බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂයේ දේශපාලන පිපිරීම මඟින් අවුලුවාලන ලද ජාත්‍යන්තර කමිටුව තුල විවෘත දේශපාලන අර්බුදය මධ්‍යයේ, ස්ටයිනර් ද ඇතුලු වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන්ට නිව් යෝර්ක් හි පැවති රැස්වීමකට ආරාධනා කරන ලදී. එහිදී මම මතභේදයට තුඩුදුන් දේශපාලන හා න්‍යායික ප්‍රශ්න සමාලෝචනය කලෙමි. ස්ටයිනර් වර්කර්ස් ලීගය ගත් ආස්ථානයට එකඟත්වය පලකල නමුදු, පක්ෂයට යලි සම්බන්ධ වීමේ අදහසක් නොමැති බව ද ප්‍රකාශ කලේය. ඔහු වෘත්තීය රැකියාවක නිරතවෙමින් සුවපහසු ජීවන රටාවක් ගොඩනඟාගෙන තිබුනු අතර එයට බාධාවක් වනු දැකීමට අසතුටු විය. එසේ වුවත් පක්ෂය සමඟ යම් ආකාරයක වඩා සමීප සම්බන්ධතාවක් පවත්වා ගැනීමට ද කැමැත්ත පල කලේය.

දේශපාලන දිවියට යලි පිවිසීම සඳහා තම අදහස පිලිබඳව ස්ටයිනර් ඇඟවුම් කලේ 1990 ගනන් අග හරියේදී පමනි. නිව් යෝර්ක් කරා මාගේ ගමන් වාරවල දී ස්ටයිනර් නිතර මා හමුවීමට කැමැත්ත පලකල අතර පක්ෂයේ න්‍යායික කටයුතු, විශේෂයෙන්ම පශ්චාත් නූතනවාදයේ බලපෑමට එරෙහි අරගලය සමඟ වාචිකව මෙන්ම ඉඳහිට ලිඛිතව ද සිය එකඟතාවය පල කලේය. නිදසුනක් ලෙස 1997 ජූනි 10 වන දින ස්ටයිනර්ගෙන් මට පහත දැක්වෙන ලිපිය ලැබුනි.

> හිතවත් ඩේව්,
>
> හොලොකෝස්ටය (නාසි ජන සංහාරය) පිලිබඳව ඔබගේ මෑත දේශනය කියවීමෙන් සතුටට පත් වීමි. [*යුදෙව් විරෝධය, ෆැසිස්ට්වාදය හා හොලොකෝස්ටය ඩැනියෙල් ගොල්ඩ්හාගන්ගේ* *Hitler's Willing Executioners* (හිට්ලර්ගේ දාස අලුගෝසුවෝ) *කෘතිය පිලිබඳ විවේචනාත්මක අගැයීමක්*] එය විශේෂයෙන්ම කාලෝචිත වන්නේ ඉතිහාසයේ නීත්‍යානුකූලභාවය පෙන්වීම සඳහා හොලොකෝස්ටය ප්‍රමුඛ නිදසුනක් සේ දක්වන බැවිනි. තමන් පශ්චාත් නූතනවාදීන් ලෙස සලකාගන්නා ලේඛකයන්

සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම සත්‍ය වන්නේය. මෙහිදී අපට දක්නට ලැබෙන්නේ (ඩෙරීඩා, ලියෝටාඩ්) වැනි යුරෝපීය ව්‍යුහවාදීන්, ඇමරිකානු තත්කාර්යවාදීන් වන රෝර්ටි වැනි අය සමඟ පොදු පෙලගැසීමකට පැමිනෙන ආකාරයයි. මේ සියල්ල "මහා ආඛ්‍යානයන්ගෙන්" චින්තනය "විමුක්ත කර ගැනීමේ" නාමයෙන් සිදුවෙයි. හබර්මාස් හා අනෙකුත් අය පෙන්වාදුන් පරිදි, හේතු යුක්තියට එල්ල කරන ඔවුන්ගේ ප්‍රහාරය, නීට්ෂේගේ සිට හයිඩෙගර් දක්වා ඍජු රේඛාවක් ඔස්සේ පසුබැසීමකි, ඔවුන්ගේ එල්ලය හේගල් හා මාක්ස් පෙරලා දැමීමයි.

පසුකාලීන නාස්තිකවාදීන් ද, සම්ප්‍රදායික තත්කාර්යවාදීන් හා අනුභූතිවාදීන් ද අතර සහයෝගිතාවය මට පෙනෙන්නේ බෙහෙවින් චිත්තාකර්ශනීය ලෙස ය. මාගේ පුද්ගලික අත්දැකීම අනුව ඔබට කිව හැක්කේ මධ්‍යම-පන්තික බුද්ධිමතුන් විශාල ස්ථරයකගේ හඬ පශ්චාත්-නූතනවාදීන් අනුනාදය කරන බවයි. මෙවන් අය සමඟ මම මෑතකදී පන්තියක් පැවැත්වීමි. එහිදී පශ්චාත්-නූතනවාදී අධිරාජයන් නිරුවතින් සිටින බව පෙන්වා දීමට උත්සාහ කලේ මා පමනි. **(24)**

ස්ටයිනර් සිය ලිපියට පසු වදනක් එක් කරමින් මා විසින් කල තවත් දේශනයක් වර්නනා කලේය. "මම බුද්ධි ප්‍රබෝධයේ සමකාලීන අරක්ෂාව සම්බන්ධ නිදසුනක් ලෙස, බුද්ධි ප්‍රබෝධය (*සමානාත්මතාවය මිනිසාගේ අයිතීන් හා සමාජවාදයේ උපත*) පිලිබඳ ඔබගේ දේශනය මාගේ හේගල් පන්තියෙහි බෙදාහැරියෙමි. (**25**)

මාස ගනනාවකට පසුව 1997 ඔක්තෝබරයේදී, වර්කර්ස් ලීගයේ තරුන නායකයෙක්වූ, 1977 දී ඝාතනය කල ටොම් හෙනහන්ගේ 20 වන සංවත්සරය වෙනුවෙන් සසප පැවැත්වූ ප්‍රසිද්ධ රැස්වීමකට ස්ටයිනර් සහභාගි විය. ස්ටයිනර් දැන සිටි හා ඇලුම් කල හෙනහන් පිලිබඳ, සමහරවිට දේශපාලනික නොව හැඟීම් බර මතකය, රැස්වීම මගින් පැහැදිලිව ම සසලවුනි. රැස්වීම අවසන් වීමෙන් පසුව ස්ටයිනර්, මාක්ස්වාදී න්‍යාය සම්බන්ධයෙන් ලිවීම සඳහා සසප සමඟ වඩා සමීපව කටයුතු කිරීමේ කැමැත්ත මා සමඟ පල කලේය. 1998 පෙබරවාරියේදී ජාත්‍යන්තර කමිටුව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* දියත් කලේය. ඉන් පසු මාස ගනනාව තුල ස්ටයිනර් හා මා ***ලෝසවෙඅ*** දර්ශනවාදී අංශය වර්ධනය කිරීමේ හැකියාවන් පිලිබඳව සාකච්ඡා වට ගනනාවක් පැවැත්වූවෙමු. ***ලෝසවෙඅ*** ගොඩනැඟීම හජාජාක පාර්ශවයෙන් "හුදු" මාධ්‍යවේදය කරා පල්ලම් බැසීමක් බව සලකන කිසිදු ඉගියක් ස්ටයිනර් වෙතින් පල නොවීය. පැවතුනේ එහි අනෙක් පැත්තයි. මාක්ස්වාදී න්‍යාය හා දේශපාලනය සඳහා ප්‍රේක්ෂකත්වය පුලුල් කිරීමේ එය සතු ශක්‍යතාවන් පිලිබඳව ඔහු උද්යෝගීමත්ව සිටියේය.

කෙසේ වුව ද, ස්ටයිනර් ව්‍යාපාරය මඟහැර සිටි වසර ගනනාව, ඔහුගේ න්‍යායික සංකල්ප මත ඉතිරිකර තිබෙන නටඹුන් පිලිබඳ ඇඟවුම් දක්නට ලැබුනි. 1998 ශරත් කාලයේ *Alienation and Revolution* (පරත්වාරෝපනය හා විප්ලවය) යන හිසින් යුත් මා වෙත ඉදිරිපත් කල රචනයෙහි, 1844 *Economic and Philosophical Manuscripts* (1844 *ආර්ථික හා දාර්ශනික අත්පිටපත්* ) හි පරත්වාරෝපනය කෙරෙහි තරුන මාක්ස් දැක්වූ ආකල්පය සමඟ ස්ටයිනර් පොරබදා ඇත්තේ ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ හා බටහිර මාක්ස්වාදී න්‍යායඥයන්ගේ රචනාවන්හි දැකිය හැකි ආකාරයට සමාන ලෙසින්ය. මාක්ස්වාදී න්‍යායේ භෞතිකවාදී හා න්‍යායික පදනම් වර්ධනය කල හා ගැඹුරු කල විශේෂයෙන්ම ශුද්ධවූ පවුල (*The Holy family*) ජර්මානු දෘෂ්ටිවාදය (*The German Idealogy*) හා දර්ශනවාදයේ දුගී කම (*The Poverty of Philosophy*) වැනි මාක්ස්ගේ පසුකාලීන කෘතීන්හි පරිමාව ස්ටයිනර් විසින් සම්පාදනය කල රචනය තුල සැලකිය යුතු තරමින් අඩු තක්සේරු කර කර තිබුනි. යලි කිහිප වතාවක් කෙටුම්පත් කර ඉදිරිපත් කල ලිපිය පිලිබඳව පවා මට සෑහීමට පත්වීමට නුපුලුවන් වූ බැවින් එය වෙබ් අඩවියෙහි පල නොකරන ලදී.**(26)** මතුපිටින් හෝ අපගේ සාකච්ඡා සුහදව සිදුවූ අතර, ස්ටයිනර් ***ලෝසවෙඅ*** වැඩ කටයුතු පිලිබඳව උද්යෝගයක් පෙන්වීය. 1999 පෙබරවාරි 16 වන දින "**ලෝසවෙඅ** සමහර මෑත කටයුතු ඉතා ඉහල මට්ටමක බව" ඔහු ලියා දැන්වීය.

මේ කාලය තුල ස්ටයිනර්, ***ලෝසවෙඅ*** නව දර්ශනවාදී අංශය වෙනුවෙන් ප්‍රකාශයක් කෙටුම්පත් කරමින් සිටියේ ය. එවැනි ප්‍රකාශන ගනනාවක් ඉදිරිපත් කල නමුත් ඒ කිසිවක් ප්‍රසිද්ධ කිරීමට සුදුසු තත්ත්වයක නොතිබුනි. නව දාර්ශනික අංශයේ මාක්ස්වාදී හා අපෝහක භෞතිකවාදී දෘෂ්ටි ආස්ථානය තහවුරු කිරීමට අවශ්‍ය න්‍යායික ඉදිරිදර්ශනය ඒවායින් ප්‍රබලව ඉදිරිපත් නොවීය. ගැටලුවේ සැඟවී පැවති මූලය මතුපිටට පැමිනියේ 1999 මැයි මාසයෙහි ප්‍රකාශනයේ අවසන් කෙටුම්පත මා අතට පත්වූ පසුවය. එය ආරම්භ වූයේ දර්ශනවාදී අංශයෙහි අරමුන අවධාරනය කරමිනි.

> නව සහශ්‍රකයේ මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්ම හා වර්ධනය සඳහා අවශ්‍ය මූලික දර්ශනවාදී ප්‍රශ්න මත සාකච්ඡාවක් දිරිගැන්වීමය.
>
> මෙම ප්‍රශ්න මොනවා ද?

මෙහිදී සමපේක්ෂනාත්මක චින්තනයේ ආරම්භය කරා එනම්, පැරනි ග්‍රීක ලෝකය තුලටම, පියවරක් පස්සට ගැනීම යෝග්‍ය විය හැකිය. ප්ලේටෝගේ සමූහාන්ඩුව තුල සොක්‍රටීස් මතු කල ප්‍රශ්නය වූයේ "යුක්ති ධර්මය යනු කුමක් ද යන්නයි?" නිකොමැකියන් ආචාර ධර්ම විද්‍යාවේදී ඇරිස්ටෝටල් ප්‍රශ්නය මතුකලේ "යහපත් ජීවිතය යනු කුමක්ද?" යන ආකාරයටයි. දර්ශනවාදීන් දෙදෙනාම සම්බන්ධයෙන් ගත් කල මෙම ප්‍රශ්න වලට යටින් පැවතුනේ, පවත්නා දෙයෙහි පැවැත්ම කුමක් ද පිලිබඳ ප්‍රශ්නයයි. පවතින හා අපට එහි ඇති සම්බන්ධය පිලබඳ මතියකින් තොරව අපට, අප ජීවත් විය යුත්තේ කෙසේද යන ප්‍රශ්නයට පිලිතුරු දීමට පටන්ගත නොහැකිය. මේ ප්‍රශ්නය ගැන සැලකිලිමත් වීම තවත් ප්‍රශ්නයකට තුඩු දෙයි. එනම් "ඥානය යනු කුමක්ද?" යන්නයි. දැනුම කෙරෙහි පලවන සියලු ප්‍රකාශන හුදු අදහස් පමනක්ද, නැතහොත් සර්වලෝක වලංගුභාවයක් සහිත යම් වර්ගයක මූලධර්ම පවතින්නේද? මේ සියලු ප්‍රශ්න අන්තර් සම්බන්ධිතය. එවන් ප්‍රශ්න එකට ඒකරාශී කිරීම හා ඒවාට පිලිතුරු සෙවීම සඳහා දරමින් තිබෙන උත්සාහය දර්ශනවාදයේ කර්තව්‍යයයි.

මේ ආරම්භය තුල ආරූඪ කරගත් බුද්ධිමය මහන්තත්වයක මූලයක් පැවතුනි. සිය පාන්ඩිත්වයට අවධානය යොමු කිරීමේ ස්වයං ආත්මීය ප්‍රයත්නයක්ද, කර්තෘගේ පාර්ශවයෙන් දක්නට ලැබුනි. එහෙත් මෙය රටාව පිලිබඳ කාරනාවකි. වඩාත් බරපතල ගැටලුව වූයේ, ද්‍රව්‍ය හා විඥානය අතර සබඳතාව පිලිබඳ කේන්ද්‍රීය අවධාරනයක් දැක්වූ දර්ශනවාදයේ මාක්ස්වාදී සංකල්පයෙන් පසු බැසීමක් ඉඟි කල, සමපේක්ෂනාත්මක චින්තනයේ මූලාරම්භයන් කරා ස්ටයිනර් පසු පියවර ගැනීමයි. මෙම ගැටලුව පිලිබඳ සාකච්ඡාව අනිවාර්යයෙන්ම යොමුවී ඇත්තේ, නොපැහිය හැකි ලෙස එකිනෙකට ප්‍රතිවිරුද්ධවූ දාර්ශනික කඳවුරු දෙකක් අතර අරගලයක ස්වරූපයකි. එනම් විඥානය මත ද්‍රව්‍යයේ ප්‍රාථමිකත්වය අවධාරනය කර ඇති භෞතිකවාදීන්ගේ කඳවුර හා එක් හෝ තවත් ආකාරයකින් විඥානයේ ප්‍රාථමිකත්වය පිලිගන්නා විඥානවාදීන්ගේ කඳවුරයි. ග්‍රීක දර්ශනවාදී උරුමයේ පිහිට පැතීමට ස්ටයිනර් කැමැත්තක් දක්වා ඇති හෙයින්, භෞතිකවාදය හා විඥානවාදය අතර ගැටුම එම සම්භාව්‍ය යුගය දක්වා සලකුනු කල හැකි වෙතැයි පෙන්වාදීම ප්‍රමානවත් වනු ඇත. **(27)** භෞතිකවාදී දෘෂ්ටි ආස්ථානය ආරක්ෂා කර වර්ධනය කිරීමේ මාධ්‍යයන් ලෙස, දාර්ශනික සඟරාවක් ඇති කිරීම මාක්ස්වාදීන්ගේ සම්ප්‍රදායික ආකල්පය විය. ස්ටයිනර්, වෙනස්වූ හා න්‍යායිකව අපැහැදිලිවූ ප්‍රවේශයක් තෝරා ගත්තේ මන්ද යන්න මා තුල කුතුහලය දැනවූ කාරනයකි. "භෞතිකවාදය" යන වචනය කෙටුම්පතෙහි කිසි තැනක සඳහන් නොවීය.

1999 ජූනි මාසයේ නිව් යෝර්ක් නගරයට ගිය අවස්ථාවකදී මම ස්ටයිනර් හමුවූයෙමි. එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් සර්බියාවට එරෙහිව ගෙන ගිය, මෑතකදී නිමාව දුටු යුද්ධය පිලිබඳව සසපයේ ස්ථාවරය මගින් තමා තුල පෙලඹීමක් ඇති කල බව ඔහු එහිදී පැවසීය. විශේෂයෙන් ඒ පිලිබඳව මවිසින් ලියන ලද ප්‍රකාශනය ඔහු පැසසුමට ලක් කලේය. (මෙම ප්‍රකාශනය, "**ජනසංහාරයෙන් ඉක්බිති: බෝල්කන් යුද්ධයේ දේශපාලන පාඩම්**" යන මැයෙන් ලෝසවෙඅ හි පලවිය.) **(28)** ඔහු සඳහන් කල පරිදි, "යුද්ධය පිලිබඳ මාක්ස්වාදී න්‍යායක්" වර්ධනය කිරීමට හැකියාව තිබූ එකම සමාජවාදී ප්‍රවනතාවය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පමනක් බව ඔහු මා සමඟ පැවසීය. මෑත සිදුවීම්, සසපයේ සාමාජිකත්වය අයැදුම් කිරීම පිලිබඳව බැරෑරුම් ලෙස සලකා බැලීම කරා තමා යොමු කල බව ස්ටයිනර් පැවසීය. එනමුදු, ප්‍රායෝගික හා න්‍යායික ස්වභාවයම පැහැදිලි කර ගත යුතු කරුනු කිහිපයක් ඇති බව ඔහු මා හට දැන්වීය. දර්ශනවාදයේ අති මූලික ප්‍රශ්නය ද්‍රව්‍ය හා විඥානය අතර සබඳතාවයයි යන එංගල්ස්ගේ අවධාරනය මේ කරුනු අතර විය. අප දෙදෙනාටම මිඩංගු කිරීමට තිබුනේ සීමිත කාලයකි. ස්ටයිනර් විසින් මතුකරනු ලබන වෙනස්කම්, කෙටුම්පත් හැඳින්වීම තුලත්, පරත්වාරෝපනය පිලිබඳ ඔහුගේ රචනයෙහිත් අපේක්ෂිතව තිබුනු ඒවා බව මට ක්ෂනිකව ප්‍රත්‍යක්ෂ විය. කෙටි සාකච්ඡාවක් තුලදී ඒවා විසඳා ගැනීමට ඉඩක් නොවීය. සිය ස්ථාවරය පැහැදිලි කරන ලිපියක් එවන මෙන් මම ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. මාගේ යෝජනාව සලකා බලන බව පිලිතුරු වශයෙන් ඔහු පැවසීය.

## (v) 1999 ජූනි 25 දින ස්ටයිනර්ගේ ලිපිය

1999 ජූනි 25 දින ස්ටයිනර්ගේ ලිපිය මා වෙත ලැබුනි. එය ආරම්භ වූයේ:

> හිතවත් ඩේව්,
>
> මෙය අප දෙදෙනා අතර පුද්ගලික ලිපි හුවමාරුවකි. කරුනාකර මේ ලිපිය අන් අයෙකුට නොපෙන්වන්න, යනුවෙනි. **(29)**
>
> බොහෝදේ කෙරෙහි අවධානය යොමුවුනි. (මෙසේමය) එහෙත් සාකච්ඡා කරන ලද කරුනු පිරික්සීමට තරම් කාල වේලා නොතිබුනි. දැන් එය ඇරඹීමට මම කැමැත්තෙමි. මා මේ සටහන් ලියන්නේ, මාගේ

සිතුවිලිවල ඉතාමත් සාමාන්‍ය සම්පිණ්ඩනයක් ලෙසය. උද්ධෘතයන් යනාදිය සොයා යාමට මෙහි ප්‍රයත්නයක් දරා නැත.

(1) භෞතිකවාදය/විඥානවාදය

දර්ශනවාදයේ ඉතිහාසය තුල මෙය අතිමූලික ගැටලුවක්ය යන්න ගැන සැකයක් තිබිය නොහැකිය. මාක්ස්වාදය, භෞතිකවාදයේ රූපාකාරයක් නිරූපනය කල බව පිලිබඳව ද ගැටලුවක් නොමැත. (මේ කරුන බොහෝවිට ඇතැම් බටහිර නව මාක්ස්වාදීන් විසින් බොඳකර දැමූ කාරනයකි.)

එය එසේ සඳහන් කරන අතරම, වෙනත් දාර්ශනික පද්ධතීන් එකිනෙකින් බෙදා වෙන් කරන මූලික ප්‍රශ්නය මෙය බව මට ඒත්තුගොස් නැත.

ස්ටයිනර්ගේ මේ ප්‍රකාශය, මාක්ස්වාදයේ න්‍යායික පදනම් සම්බන්ධයෙන් ප්‍රධානතම විරෝධයකට වඩා අන් කිසිවක් ලෙස අවබෝධ කරගත නොහැක. මේ ප්‍රකාශයෙන් සිය ලිපිය ඇරඹීම මගින් එහි දුරදිග විහිදෙන ගම්‍යයන් ස්ටයිනර් විසින් පිලිගෙන ඇත. වෙනත් ලෙසකින් ඔහුට කටයුතු කල හැක්කේ කෙසේද? දර්ශනවාදයේ ඉතිහාසය ද, ඒ තුල භෞතිකවාදී තර්ක ශාස්ත්‍රයේ අනුසන්ධානය, ඥානවිභාගය හා ඥානය පිලිබඳ මාක්ස්වාදී සංකල්පය ස්ටයිනර් ප්‍රශ්නයට බඳුන් කරයි. **(30)** 1975 වසර තරම් ඈතදී, සමාජවාදී කම්කරු පක්ෂයේ (එස්ඩබ්ලිව්පී) තත්කාර්යවාදී දෘෂ්ටියට එරෙහිව කේන්ද්‍රීය භූමිකාවක් ඉටුකරමින් තවමත් වර්කර්ස් ලීගයේ සාමාජිකයෙකුව සිටිය දී ස්ටයිනර්, මෙම ප්‍රශ්නය මත එස්ඩබ්ලිව්පී යේ ප්‍රධාන න්‍යායාචාර්යවරයා වූ ජෝර්ජ් නොවැක් ට නිශ්චිත ලෙස පහර දුන්නේය. ඔහු මෙසේ ලිවීය: "ද්‍රව්‍යයේ හෝ චින්තනයේ ප්‍රමුඛත්වය පිලිබඳ ප්‍රශ්නය අර්ථ විරහිත යයි ද, යම්කිසි තෙවැනි ආස්ථානයකට ඉඩකඩ ඇතැයිද පැතිර පවතින මිථ්‍යාවට නොවැක් අනුගත වන්නේ ය." **(31)** වසරකට පසුව ටිම් වුල්ෆර්ත් ගේ න්‍යායික සංකල්ප ගැන පිරික්සුමකදී "භෞතිකවාදය හෝ විඥානවාදය පිලිබඳ දර්ශනවාදයේ අති මූලික ප්‍රශ්නය ඉවත දැමීමේ හා නොතකාහැරීමේ" ප්‍රයත්නයක නිරතවීම සම්බන්ධයෙන් ස්ටයිනර් ඔහු හෙලා දැක්කේය. වුල්ෆර්ත්ගේ ආස්ථානය "විඥානවාදී කැලි කසල" **(32)** ලෙස ස්ටයිනර් තවදුරටත් විස්තර කලේය.

ස්ටයිනර්ගේ 1999 ජූනි මාසයේ ලිපිය, විභව න්‍යායික ගැටුමට අදාල ක්ෂේත්‍රයන් තව දුරටත් විස්තාරනය කිරීම කරා යොමු විය:

(2) විඥානයට සාපේක්ෂව පැවැත්මේ ප්‍රමුඛත්වය සත්තකින්ම, මාක්ස්ගේ භෞතිකවාදයට අනුව, ඓතිහාසිකව හා තාර්කිකව යන දෙයාකාරයෙන්ම, විඥානයට වඩා පැවැත්ම ප්‍රමුඛ ලෙස පිලිගැනේ. (සැබවින්ම ඒ ගැන සිතීමට අප නොසිටිය ද) විඥානයෙන් තොරව පැවැත්ම තිබිය හැකි නමුත්, පැවැත්මෙන් තොරව විඥානය තිබිය නොහැකිය. එසේ කියන අතරම, සමාජ භාවිතයේ ස්වරූපයෙන් ප්‍රානවත් කල විට විඥානයට ද පැවැත්ම වෙනස් කල හැකිය. ඇතැම් අවස්ථාවල එය තීරනාත්මක බලපෑමක් බවට පත්වේ.

පැවැත්මේ තර්කානුකූල ප්‍රමුඛත්වය මෙන්ම, පැවැත්ම හා විඥානය අතර අන්‍යෝන්‍ය සබඳතාව ද මාක්ස්වාදයට වැදගත් වේ. තව ද, පැවැත්මේ මට්ටම් ගනනාවක් ඇත. සෑම මට්ටමක්ම එයටම විශේෂිතවූ ප්‍රවර්ග හා චලිතය පිලිබඳ නියාමයන් ඇත. පැවැත්මේ සෑම අනුක්‍රමාධිපත්‍ය මට්ටමක් තුල ද, ඒ අතර ද ඇති සංකීර්න අන්තර් සබඳතා වූ කලී පිරික්සුමට ලක්වන අබන්ඩ විෂයකි.

පැවැත්ම විඥානයට ප්‍රමුඛ වන්නේය යන වැකි කඩ පුන පුනා කීමෙන් කිසිවක් විසඳෙනු ඇතැයි විශ්වාස කරන කෙනෙක් සිටී නම් ඔවුන්, හුදෙක් බුද්ධිමය අලස කමෙන් තමන්ම රවටා ගන්නා පුද්ගලයන්ය. (සැබවින්ම, ඔබ එසේ කරන්නේ යයි මම නොකියමි. - එනමුදු, මතුපිටින් මාක්ස්වාදීන් ලෙස පෙනී සිටින බොහෝ අය කරන්නේ මේ ටිකමය. එසේ කර තමන් යමක් විශ්ලේෂනය කර තිබේ යයි ඔවුහු විශ්වාස කරති.)

මට පෙනී ගිය ආකාරයට ස්ටයිනර්, මාක්ස්වාදයට සතුරු න්‍යායික ප්‍රවනතාවන්ගේ ගුරුත්වාකර්ෂනීය කේන්ද්‍රය තුලට පාවීගොස් ඇත. මෙම ඡේද, "බටහිර මාක්ස්වාදය" ලෙස හඳුන්වනු ලබන ප්‍රවනතාවන් සමන්විත වන නොයෙකුත් "භාවිත" දාර්ශනිකයන්ගේ, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයට අනුබද්ධ අයගේ හා අනෙකුත් දාර්ශනිකව සාරසංග්‍රහවාදී ප්‍රවනතාවන්ගේ ලියවිලි තුල දක්නට ඇති උද්ධෘත සිහියට නංවයි. මේ විවිධාකාර ප්‍රවනතා එකට බැඳ තබන බුද්ධිමය හුයපට නම්, දාර්ශනික භෞතිකවාදය සමඟ ඒවාට ඇති අතෘප්තිය හා නො එකඟතාවයි. "පැවැත්ම හා විඥානය අතර අන්‍යෝන්‍ය සබඳතාව සේම පැවැත්මේ තර්කාන්විත ප්‍රමුඛත්වය ද

මාක්ස්වාදයට *වැදගත් වේ* යන ස්ටයිනර්ගේ අවධාරනය, දාර්ශනික විඥානවාදයට පිරිනැමූ මූලික සහනයකි." (අවධාරනය අපේ) පැවැත්ම හා විඥානය අතර අන්තර් ක්‍රියාකාරිත්වය පිලිබඳ අවබෝධ කර ගත හැක්කේ, විඥානයට ප්‍රාථමිකව ද්‍රව්‍යයේ ප්‍රාථමිකත්වය පිලිගැනීමේ පදනම මත පමනි. තවද, ලෝක විද්‍යාත්මක දෘෂ්ටියක් ලෙස මාක්ස්වාදය, මානව වර්ගයා, මනස හා විඥානය සලකන්නේ ස්වභාව ධර්මයේ අපෝහක පරිනාමයෙහි නිමැවුමක් ලෙසය. විඥානවාදී පැහැයෙන් යුත් දර්ශනවාදයක පිහිටා නොව, විද්‍යාවේ දෘෂ්ටි ආස්ථානයෙන් ගත් කල පැවැත්මේ ප්‍රමුඛත්වය හුදෙක් *තර්කානුකුල* ප්‍රමුඛත්වයක් නොව, *භෞතික හා ඓතිහාසික* ප්‍රමුඛත්වයකි. **(33)**

ඉන් පසු ඡේද වලින් ඉදිරිපත් කෙරුනේ සම්භාව්‍ය මාක්ස්වාදය කෙරෙහි පලවන සුපුරුදු වෛහෙසකර විරෝධයයි. සහජ කුසලතාවන්ගෙන් මුලුමනින්ම හිඟ නොවූව ද එංගල්ස්, මාක්ස්වාදය ග්‍රාම්‍යකරනයෙහි ලා යම් ආකාරයකට දායක වී ඇති බවට ඇඟවීමක් තිබේ. එංගල්ස් යනු මාක්ස් නොවීය. මාක්ස් ප්‍රමුඛව ම න්‍යායාචාර්ය වරයාය. එංගල්ස් එය ජනප්‍රිය කල පුද්ගලයාය. එංගල්ස් සතුව පැවතුනා යයි කියන මේ අපැහැදිලි උරුමය පිලිබඳ සමාලෝචනය පිටුපසින් පැවතියේ ලෙනින්ගේ *භෞතිකවාදය හා අනුභූතික විචාරය* නමැති කෘතිය පිලිබඳ සුපුරුදු විවේචනයකි. "...මේ කෘතිය තුල ලෙනින් අර්ථ දැක්වූ භෞතිකවාදය පිලිබඳ සංස්කරනය හා වඩාත් සමානකම් ඇත්තේ මාක්ස්ගේ භෞතිකවාදී අපෝහකයට නොව, 18 වන සියවසේ යාන්ත්‍රික භෞතිකවාදයටයි. ස්ටයිනර්ගේ තර්ක - *භෞතිකවාදය හා අනුභූතික විචාරය* නමැති කෘතියෙහි එන 'ග්‍රාම්‍ය' භෞතිකවාදී ලෙනින්ට *දාර්ශනික සටහන්පොත්* වල එන හෙගලියානුකරනයට ලක් කරන ලද "අපෝහකවාදී ලෙනින් එරෙහිව පිහිටුවන" - මාක්ස්වාදයේ විඥානවාදී විරුද්ධවාදීන්ගේ ලියවිලි වල අතීතයේ බොහෝ අවස්ථාවල මා දැක ඇත.

මෙහි බලාපොරොත්තු තැබිය හැකි එක් සටහනක් විය. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයෙහි දාර්ශනික උරුමයේ සාරභූත අංග ලෙස තමා අවබෝධ කර ගත් දෑ පිලිබඳ ඔහුගේ තියුනු විවේචනය කෙසේ වුව ද, ජාත්‍යන්තර කමිටුවේ දේශපාලන වර්ධනය පිලිබඳ සතුටුදායක තක්සේරුවක් ස්ටයිනර් ඉදිරිපත් කලේය.

> පසුගිය දශක දෙක තුල සිද්ධීන්, මාක්ස්වාදය යලි ශක්තිමත් කිරීමට වඩාත් වාසිදායක කොන්දේසි නිර්මානය කර තිබේ. ජාත්‍යන්තර කමිටුව තුල 1985 භේදය හා පැහැදිලි කිරීම, 1980 ගනන් අග හා 1990 ගනන් මුල් භාගයේ ස්ටැලින්වාදයෙහි බිඳවැටීම හා භූගෝලකෘත සන්නිවේදනයේ හා තාක්ෂනයේ වර්ධනය සැලකිය යුතුය. පසුගිය වසර පුරා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* බලපෑම හා විශේෂයෙන්ම, පසුගිය මාස කිහිපය තුල ක්ලින්ටන් දෝෂාභියෝගයට ලක් කිරීමේ ආයාසය හා යුගෝස්ලාවියාවට එරෙහි යුද්ධය පිලිබඳ එහි අගනා විවරන ලොව පුරා බහුතර ප්‍රේක්ෂක පිරිසක් කරා ලඟාවීමට ඇති දැවැන්ත සම්භාව්‍යතාවන් පෙන්නුම් කොට ඇත. **(34)**

"දර්ශනවාදය හා පක්ෂය" අතර සම්බන්ධතාව වෙත සිය අවධානය යොමු කරමින්, "ජාත්‍යන්තර දේශපාලන පක්ෂයක් ලෙස සංවිධානය වූ මාක්ස්වාදී ව්‍යාපාරයට, මාක්ස්වාදී දර්ශනවාදයේ වර්ධනය තුල වැදගත් භූමිකාවක් ඉටුකිරීමේ හැකියාවක් ඇති බවත්, එසේ ඉටුකර ඇති බවත්" ස්ටයිනර් පිලිගෙන ඇත. මෙය ව්‍යාකූලත්වයට තුඩුදෙන ප්‍රකාශයකි. මන්දයත්, මාක්ස්වාදය වර්ධනය කෙරී ඇත්තේ අනෙකුත් කිනම් *අවස්ථාවකදී හා අන් කවරෙකු ද?* මාක්ස්වාදී ව්‍යාපාරයෙන් පරිබාහිරව හා එයට අසම්බන්ධිතව තනි පුද්ගල න්‍යායාචාර්යවරුන් විසින් මාක්ස්වාදී දර්ශනවාදය වර්ධනය කිරීම පිලබඳව නිශ්චිත නිදසුනක් ස්ටයිනර් ඉදිරිපත් කර නැත. "දර්ශනවාදයට වැදගත්වූ වර්ධනයන් ඇතිවන්නේ, නිදසුනක් ලෙස, සංක්ෂෝභන න්‍යායන්ගෙන් (chaos theory) මෙන් ඉතාමත් අනපේක්ෂිත දිසාවන්ගෙන්" බව ඔහු සටහන් කරයි. එසේ වුවද, ස්ටයිනර් තව දුරටත් මෙසේ ලිවීය. "මේ වර්ධනයන්ගේ පූර්න ඒකාග්‍රකරනය හා සමවබෝධය ඇති වීමේ හැකියාව පවතින්නේ මාක්ස්වාදයේ රාමුව තුල පමනක් යයි මම සැබවින්ම විශ්වාස කරමි. එසේ වුව ද, 1. ප්‍රස්තුත විෂය පිලිබඳ නිපුනත්වය නොලබා මෙම වර්ධනයන් ග්‍රහනය කර ගැනීමට හැකියාව ලබාදෙන කිසියම් වරප්‍රසාදිත තත්ත්වයක සිටින්නේ මාක්ස්වාදීන් පමනකැයි ද, 2. මෙම වර්ධනයන් ගැන මාක්ස්වාදීන් නොවන්නන්ට වැදගත් යමක් කීමට නැතැයි යන්න ද ඉන් අදහස් නොවේ."

යම්තාක් දුරකට කලහකාරී ස්වරයකින් ලියන ලද මෙම සටහන් කියවූ විට මට පෙනී ගියේ මුලුමනින්ම පැහැදිලි නැති න්‍යාය පත්‍රයක් ඉටුකිරීමෙහි ලා ස්ටයිනර්, වාචාල පඹයන් පෙලක් සූදානම් කල බවකි. ඉන් කුමක් අදහස් කලද ගැටලුව, "වරප්‍රසාදිත තත්ත්වයක්" පිලිබඳව නොව, මාක්ස්වාදය ඉටු කරන ක්‍රියාකලාපයයි. එනම්, ස්වභාවධර්මය, සමාජය හා විඥානය පිලිබඳ විද්‍යාත්මක අවබෝධයක් ගොඩනැඟීම තුලදී භෞතිකවාදී දර්ශනවාදයේ වඩාත්ම දියුනු හා සංගත ස්වරූපයේ, සාරභූත භූමිකාව පිලිබඳ කාරනයකි. අවශ්‍යයෙන්ම විප්ලවකාරී දේශපාලන ක්ෂේත්‍රයෙන් පරිබාහිරව ඉස්මතු වන සංක්ෂෝභන න්‍යායේ සූත්‍රගත කිරීම වැනි වර්ධනයන් ප්‍රතික්ෂේප කරන ලද්දේ කිනම් "මාක්ස්වාදීන්" විසින් ද යන්න පිලිබඳව වඩාත්ම අවධානය යොමුකල මනාය. එංගල්ස්ගේ පුරෝගාමී

කෘතීන් කරා ඇතට දිව යන සම්භාව්‍ය මාක්ස්වාදයේ න්‍යායික සම්ප්‍රදායන්, භෞතිකවාදයේ වර්ධනය තුල ස්වාභාවික විද්‍යාවට හැම විටම පවරා ඇත්තේ තීරනාත්මක භූමිකාවකි. එනමුදු, විද්‍යාඥයින් අත්පත් කර ගන්නා ලද දියුනුව, විද්‍යාත්මක පර්යේෂනයේ සියලු ක්ෂේත්‍රයන් තුල අපෝහක විධික්‍රමයේ සවිඥානක උපයෝගය හා සංගතවූ භෞතිකවාදී ලෝක දෘෂ්ටියක් ප්‍රවර්ධනය කිරීමෙහිලා, හා අන් සියල්ලටමත් වඩා, සමස්තයක් ලෙස සංස්කෘතියේම ප්‍රගතිශීලී වර්ධනය වෙනුවෙන් වාසිදායක දේශපාලන හා බුද්ධිමය පරිසරයක් ගොඩනැගීම සඳහා යත්න දැරීමේදී, මාක්ස්වාදීන් විසින් ඉටුකරන ලද තීරනාත්මක භූමිකාව කිසිසේත්ම වැදගත්කමින් හීන නොකරයි. ධනේශ්වර රාජ්‍යයේ ඉහලම තලයන්ගේ සහාය, බුද්ධි විරෝධයට හා සමාජ පසුගාමිත්වයට හිමිවන කාල වකවානුවක දී, එවැනි වැඩකටයුතුවල තීරනාත්මක ස්වභාවය අතිශයෝක්තියෙන් දැක්වීමට අවශ්‍යතාවක් නොමැත.

ස්ටයිනර් සිය ලිපියේ මේ කොටස අවසන් කලේ, තවත් දුර්බෝධ සටහනක් තබමිනි. "තවද, එවැනි වර්ධනයන් අප විසින් දැකිය යුත්තේ, හුදෙක් අපගේ (සනීභූත) ඉදිරිදර්ශනයේ නිරවද්‍යතාව පැහැදිලි කරන තවත් නිදසුනක් ලෙස නොව, අපගේ න්‍යායික සමවබෝධය සුපෝෂනය කිරීම සඳහා මාවත් ලෙස" යයි ඔහු ලිව්ය.

තවද, සංක්ෂෝභන න්‍යාය පිලිබඳව කරන ලද අපැහැදිලි සඳහන හැරුනු කල, ඔහු සඳහන් කල "වර්ධනයන්" පිලිබඳ නිශ්චිත නිදසුනක් ස්ටයිනර් ඉදිරිපත් නොකලේය. එනමුත්, ඊටත් වඩා ප්‍රශ්නකාරී මාක්ස්වාදී ඉදිරිදර්ශනය "සනීභූත" වූවක් ලෙස ඔහු විසින් විස්තර කිරීමයි. එම වදන වරහන් තුල ප්‍රයෝගකාරී ලෙස බහාලීමෙන් එහි අසංගත හඬෙහි බලපෑම අඩු නොකරයි. සමස්තයක් වශයෙන් ගත්කල ඔහුගේ සූත්‍රගත කිරීම් කෙතරම් ව්‍යාකූල වුවත්, සිය ලිපියේ මෙම කොටස තුල ස්ටයිනර් විසින් ඉදිරිපත් කරන ලද තර්ක, අනෙකුත් දාර්ශනික මත වලට එරෙහි මාක්ස්වාදී සංකල්ප ආරක්ෂා කිරීමට විරුද්ධව මෙහෙයවූ ඒවා සේ පෙනී යයි.

ඔහුගේ ප්‍රකාශවල කරදරකාරී ගම්‍යයන් වඩාත් පැහැදිලිව දිස් වන්නේ, ඔහුගේ ලිපියේ අවසාන කොටසෙහිය. එහි දී ස්ටයිනර් පක්ෂ සාමාජිකත්වය පිලිබඳ ප්‍රශ්නය කරා යොමුවෙයි. ඔහු මෙසේ කියා සිටී.

> ...දර්ශනවාදය කෙරේ ආධානග්‍රාහී ආකල්පයක් ඇති පක්ෂයක් තුල මට පලදායී ලෙස කටයුතු කල නොහැකි වනු ඇත. අද දින සසපය හා ජාත්‍යන්තර කමිටුව තුල ආධානග්‍රාහී ආකල්පයක් ඇතැයි මම නොකියමි. **ලෝසවෙඅ** තුල ඉතාම විවෘත හා ප්‍රබෝධමත් ආකල්පයක් ප්‍රකාශිත වනු මම දැක ඇත්තෙමි. ඇතැම් සහෝදරවරුන්ට මා ප්‍රකාශ කර ඇති අදහස් සම්භාව්‍ය නොවන ඒවා ලෙස පෙනෙන්නට පුලුවන. යමෙක් මේ අදහස් සමඟ අවශ්‍යයෙන්ම එකඟ විය යුතුයයි මම අවධාරනය නොකරමි. එසේ වුවද, මේ අදහස් ඉදිරිපත් කිරීමට පොදු වේදිකාවක් සකසා දිය යුතු යයිද ඒ දෙස විවෘත ආකල්පයකින් බලනු ඇතැයි ද මම අපේක්ෂා කරමි.

දර්ශනවාදය හා සසප සාමාජිකත්වය පිලිබඳ සාකච්ඡාවට බඳුන්වන ලිපියක, එහි සියලු අවමාන සහිත ගුඪාර්ථද සමග, ස්ටයිනර් අධානග්‍රාහයේ අවතාරය ඉස්මතු කලේ මන්ද? අධානග්‍රාහී ආකල්පයක ගුනාංග වනුයේ, ආගමකට සමාන අන්ධ හා අනම්‍ය විශ්වාසයන් පෙලකි. මේවා, කරුනු කාරනා හා හේතු මත පදනම් වන තර්ක වැද්ද නොගනියි. මාක්ස්වාදයේ සතුරන් විසින් නිරන්තරයෙන්ම පාහේ අධානග්‍රාහය පිලිබඳ චෝදනාව එල්ල කලේ භෞතිකවාදය ආරක්ෂා කිරීම අපකීර්තියට පත්කිරීමේ උත්සාහයක් වශයෙනි. **(35)** 1970 ගනන් මුල් භාගය තරම් දුරකදී, මෙම වදන් වලින්ම ජාත්‍යන්තර කමිටුවට පහර දුන් බව ස්ටයිනර්ට මතක තිබිය යුතුය. එකල ජෝර්ජ් නොවැක්, දර්ශනවාදයේ විඥානවාදී ගුරුකුලවලට ජාත්‍යන්තර කමිටුව පෑ විරෝධය හංවඩු ගැසුවේ "නිකායවාදය" ලෙසය. මවිසින් දැනටමත් උපුටා දක්වා ඇති, ස්ටයිනර්ගේ 1975 වසරේ "මාක්ස්වාදය, තත්කාර්යවාදය හා සංශෝධනවාදය" යන ලිපිය නොවැක්ගේ ප්‍රහාරයට පිලිතුරු සැපයූ ප්‍රකාශ ගනනාවකින් එකකි. **(36)** පැවැත්ම හා විඥානය අතර සබඳතාවය පිලිබඳ මාක්ස්වාදී සූත්‍රගතකිරීම්වලට ස්ටයිනර් පෑ විරෝධය, මූලික භෞතිකවාදී සංකල්ප ආරක්ෂා කිරීම බුද්ධිමය අලසකම ලෙසට ඔහු කරන මුබරි අනන්‍යකරනය හා "සනීභූත" ඉදිරිදර්ශන පිලිබඳ ඔහුගේ ප්‍රකාශ යනාදියේ සන්දර්භය තුල "දර්ශනවාදය කෙරේ අධානග්‍රාහී ආකල්පයක්" පිලිබඳ කාරනය මතු කිරීම, පක්ෂයේ ඉදිරි පෙල හරහා ස්ටයිනර් විසින් තබන ලද අනතුරු ඇඟවීමේ වෙඩිල්ලක ස්වරූපය ගත්තේය.

අවසාන වශයෙන් ස්ටයිනර්ගේ ලිපිය නිමාවූයේ නොවරදින සුලු දෙගිඩියා සහගත ස්වරයකිනි.

> එසේ වුවද, මා තුල තවමත් යම් සංශයන් ඇති බව නොපිලිගන්නේ නම් මා අවංක නොවනු ඇත. සංවිධානය තුලට මා කෙසේ ගැලපෙනු ඇත්දැයි යන්න ගැන මට පූර්න විශ්වාසයක් නැත. මගේ කාලය හා මගේ මූල්‍ය සහාය අතින්, මා කිරීමට සූදානම් වන කැපකිරීමේ මට්ටම, පක්ෂ සාමාජිකත්වය ලබාගැනීම සඳහා ප්‍රමානවත් වේදැයි මට නිසැකව ම කිව නොහැකිය. අනෙක් අතට, පක්ෂ සාමාජිකත්වයේ භූමිකාව ඉටුකිරීමට

යත්න දැරීමකින් තොරව, මේ ප්‍රශ්න වලට පිලිතුර නිශ්චය කර ගැනීම සඳහා මට අන් මගක් ද නොමැත.

මගේ මේ සියලු කොන්දේසි කියවීමෙන් පසුව වුව ද, මා පක්ෂයට බැඳිය යුතු යයි ඔබ සිතන්නේ නම් මා එසේ කරමි. එසේ වුව ද, මට දැනෙනුයේ එය පරීක්ෂනයට තබන ලද සාමාජිකත්වයක් ලෙසට ය.

සිය පුද්ගලික දේශපාලන කැපවීම පිලිබඳ දැඩි කොන්දේසි සහිත මෙම ප්‍රකාශනයත් සමඟ ස්ටයිනර්, සිය ලිපිය අවසන් කලේය. **සසපයෙන්** හා ජාත්‍යන්තර කමිටුවෙන් වෙනස්වූ දේශපාලන පරාවක්‍රයක ස්ටයිනර් පැහැදිලිව ම ගමන් ගනිමින් සිටියි. ඔහු **සසපයට** බැඳෙන්නේ නම්, එය සිදුවිය යුත්තේ ඔහුගේ කොන්දේසි මතය. සාමාජිකයෙකු වීමට ඔහු දක්වන උනන්දුව මූලික වශයෙන්ම, හතරවන ජාත්‍යන්තරයේ දාර්ශනික ආස්ථානයට ආගන්තුක වූ න්‍යායික වේදිකාවක් පෙරට ගනිමින්, **ලෝසවෙඅ** හරහා ජනතා වේදිකාවක් තනාගැනීම වන්නේය. මාක්ස්වාදය විවේචනය කිරීම සඳහා ස්ටයිනර්ට ලොව පුරා පාඨක පිරිසක් සපයා දීමට හිලව් වශයෙන්, තමා ලබාදීමට කැමති සිය නිදහස් කාලයෙන් හා මාරු කාසිවලින් කිසියම් කුඩා පංගුවක් සසපයට හිමිවනු ඇත.

### (vi) ස්ටයිනර් සසපයට ඉදිරිපත් කල ඉල්ලුම් පත්‍රය

ඉන් සති ගනනාවකට පසුව 1999 අගෝස්තුවේදී, සාමාජිකත්වය සඳහා විධිමත් ඉල්ලුම් පතක්, ස්ටයිනර් විසින් සසප දේශපාලන කමිටුවට එවනු ලැබුනි.**(37)** මෙය, ජූනි මාසයේදී මා වෙත එවන ලද ලිපියට බොහෝ සෙයින් වෙනස්වූ ලියවිල්ලකි. ජූනි මාසයේදී ඔහු විසින් මතු කරන ලද දාර්ශනික ප්‍රශ්න පිලිබඳ මතභේද ගැන ස්ටයිනර්ගේ ඉල්ලුම්පතෙහි සඳහනක් නොවීය. සසපයේ දේශපාලන දිශානතිය හා භාවිතයට අදාල ඔහුගේ විවේචන පිලිබඳව ද ලිපියෙන් ඇඟවුම් කලේ නැත. "වෛෂයිකවාදය" හා "වර්ජකවාදය" හෝ, ඒ කාරනයේදී "පරිහානිය" පිලිබඳව ද කිසිදු සඳහනක් නොවීය. ස්ටයිනර්-බ්‍රෙනර්ගේ එම්ඩබ්ලිව්එච්එච් (වෙබ් අඩවිය) මත විශ්වාසය තැබිය හැකි නම් මේ ප්‍රවනතා, 1993 වසරේ පටන්ම ක්‍රියාත්මක වෙමින් තිබුනි. ඒ, ස්ටයිනර් සාමාජිකයෙකු වීමට තීරනය කිරීමට හය වසරකට පෙරාතුවය! තත්කාර්යවාදයට එරෙහිව සටන් කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් ස්ටයිනර්, සසප විවේචනය කලේද නැත. ප්‍රබුද්ධත්වය පිලිබඳව අවිවේචනාත්මක දෘෂ්ටියක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් ස්ටයිනර්, පක්ෂයට තදින් දොස් නැගුවේද නැත.

දේශපාලන කමිටුව වෙත ස්ටයිනර් විසින් එවන ලද ලියවිල්ල, දීර්ඝ වූ ද, අපූර්ව ලෙස අව්‍යාජ වූ ද ස්වයං චරිතාපදාන ප්‍රකාශනයක් විය. හජාජාක ට එල්ල කරන ලද ස්ටයිනර්-බ්‍රෙනර් ප්‍රහාරයෙන් මතු කරන ලද දේශපාලන ප්‍රශ්නවලට සම්බන්ධ, ලියවිල්ලේ අදාල කොටස්වලින් පමනක් මම උපුටා දක්වමි.

ස්ටයිනර් සිය රචනය පටන් ගත්තේ, සිය බුද්ධිමය පසුබිම සමාලෝචනය කරමිනි. තමන් තුල අනුක්‍රමයෙන් ඇතිවූ රැඩිකලීකරන ක්‍රියාවලිය ඔහු විස්තර කලේය. "පශ්චාත් යුද කාලපරිච්ඡේදයේ දේශපාලන නිහඬතාව, 1960 ගනන් අග භාගයේදී නිට්ඨාවට ම අවසන්වූ පසුව, නව ශිෂ්‍ය ව්‍යාපාරය වෙත මම නිරායාසයෙන්ම ඇදී ආවෙමි. මගේ පරම්පරාවේ බොහෝ දෙනාගේ දේශපාලනික සංවේදනයන් බෙදා හදා ගනිමින් මම, නව වාමවාදියෙක් ලෙස සලකා ගත්තෙමි." තමා නිව් යෝර්ක්හි පිහිටි සමාජ පර්යේෂන සඳහා නව විද්‍යායතනයේ දර්ශනය අධ්‍යයනය කල බව ස්ටයිනර් යලි සිහිගැන්වීය. මෙය සමාජ පරියේෂන සඳහා හෝර්ක්හයිමර්ගේ ආයතනයට (ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයට) බුද්ධිමය වශයෙන් සම්බන්ධවූ ආයතනයකි. තමාගේ දර්ශනවාදී ආසක්තයන් පිලිබඳ ක්ෂේත්‍රයන් ගැන සඳහන් කලද, නව විද්‍යායතනයේදී තමාට අභිමුඛවූ ප්‍රධාන න්‍යායික බලපෑම් ස්ටයිනර් සමාලෝචනය කලේ නැත. ඒ, (මාකියුස් මෙන්) මාටින් හයිඩෙගර්ගේ කලින් ශිෂ්‍යාවක වූ හැනා අරෙන්ඩ් එකල එහි ප්‍රමුඛත්වයක් ගත් අයෙකුව සිටිය දී ය. සිය දේශපාලනයේදී ස්ටයිනර් පිලිගත්තේ

> ...නව වම්මුන් අතර සංසරනයවූ බාගෙට තැම්බුනු දේව පුරාන හා පුරාවෘත්ත තරමක් දුරට අවිවේචනාත්මකව මම පිලිගත්තෙමි. බ්ලැක් පැන්තර් පක්ෂය විසින් ප්‍රචලිත කරන ලද "ඇමරිකාව ෆැසිස්ට් රාජ්‍යයක්ය" යන න්‍යාය මේ කවයන් තුල "විශ්ලේෂනය" ලෙස පිලිගැනුනු උන්මාදයෙන් පිරි සංවේදනවාදය පිලිබඳ සංකේතාත්මක එලිදැක්වීමක් බඳුය. (38)

ස්ටයිනර් වර්කර්ස් ලීගයට බැඳුනේ 1970 වසරේය. වර්කර්ස් ලීගයේ ඓතිහාසිකව පදනම්වූ ඉදිරි දර්ශනය සිය වර්ධනය කෙරෙහි ඇතිකල දැවැන්ත බලපෑම ඔහු සාකච්ඡාවට බඳුන් කලේය.

> ප්‍රථමකොටම මාගේ මතකයට නංවාගත හැක්කේ, එය මා වෙත වර්තමාන සමාජ හා දේශපාලන යථාර්තය පිලිබඳව තර්කානුකූල පැහැදිලි කිරීමක් ඉදිරිපත් කල අවස්ථාවයි. එතෙක් ඒ පිලිබඳව මා ප්‍රතිචාර දක්වා තිබුනේ හැඟීම්බර ආකාරයකිනි.
>
> මාක්ස්වාදියෙකු වශයෙන් මාගේ අධ්‍යාපනය ඇරඹිනි. සති ගනනාවක් තිස්සේ කියවීමෙන් ද, දේශනවලට සවන් දීමෙන් ද,

පැය ගනන් සාකච්ඡාවලට සහභාගී වීමෙන් ද අනතුරුව, මාක්ස්වාදය එක්සත් ජනපදය තුල අප මුහුනදෙන ගැටලුවලට අදාල කොට ගත් විට, සැබවින්ම ජීවමාන ව්‍යාපාරයකැයි මම ඒත්තු ගත්තෙමි. අපගේ අවධියේදී මාක්ස්වාදයේ එකම අව්‍යාජ අඛන්ඩතාව නියෝජනය කලේ ට්‍රොට්ස්කිවාදය යයි මාක්ස්වාදී ව්‍යාපාරයේ ඉතිහාසය පිලිබඳ අධ්‍යයනය තුලින් මට ඒත්තු ගැන්වුනි.

මාක්ස්වාදයේ සියලු සම්භාව්‍ය කෘති, එනම්, මාක්ස්, ලෙනින්, ට්‍රොට්ස්කි, ප්ලෙකනෝව්, මේරිංග්, කවුට්ස්කි හා ලක්සම්බර්ග් යන අයගේ කෘති, මම කියවීමි. (39)

ස්ටයිනර්ගේ ලිපිය ඉන්පසු 1973-74 වසරවල සිද්ධීන් වෙත යොමු විය. "ඒ අවධියේදී වර්කර්ස් ලීගය හා ඒ සමග මම ද, ජාතික ලේකම් ටිම් වුල්ෆර්ත්ගේ ධාරනාවාදී ඉදිරි දර්ශනය මඟින් ඇතිකරන ලද ගැඹුරු අර්බුදයකට මුහුනපා සිටියෙමු." වර්කර්ස් ලීගය හා ඔහු මත වුල්ෆර්ත්ගේ කටයුතු වලින් ඇතිකල බලපෑම ලිපියෙන් විස්තර කෙරිනි. එහෙත් මෙහිදී ඔහුගේ වෘත්තාන්තය අතිශයින්ම ආත්මීය ස්වරයක් ගත් අතර, ඔහුගේ බලගතු දේශපාලන දුබලතා ද හෙලිදරව් කලේය. පෞද්ගලික වශයෙන් තමන් වෙත වුල්ෆර්ත් විසින් එල්ල කරන ලද ප්‍රහාර ද, "නිමක් නැතිව ගලා ආ හේතුවක් නැති වැඩ රාශියක" බර ඔහු මත පැටවීම ද ස්ටයිනර් සිහිපත් කලේය. "මෙයින් අරමුනු කෙරුනේ මා, හුදෙකලා කොට, අධෛර්යයට පත්කොට, පක්ෂය හැර යාමට මා හට අනුබල දීමය. "මාස කිහිපයක් තුල ඔහුට (වුල්ෆර්ත්ට) තම අභිප්‍රාය ඉටු කර ගැනීමට හැකි විය. මම ව්‍යාපාරය හැර ගියෙමි." සත්තකින්ම වුල්ෆර්ත්ගේ හැසිරීම ඉතා දුෂ්ඨ විය. එහෙත් වුල්ෆර්ත්ගේ ප්‍රකෝපකරනයන්ට දේශපාලන වශයෙන් තමන් යටත් වූයේ මන්දැයි පිරික්සා බැලීමට ස්ටයිනර් අපොහොසත් විය. වුල්ෆර්ත්ට ප්‍රතිරෝධය පාමින් ඔහුට විරුද්ධවූ වෙනත් අය ද පක්ෂය තුල සිටියහ. වර්කර්ස් ලීගය තුල අර්බුදය වර්ධනය වීමට බලපෑ වඩාත් ගැඹුරු දේශපාලන හේතු පැහැදිලි කිරීමට ස්ටයිනර් උත්සාහයක් දැරුවේ ද නැත. වෝටගේට් සිද්ධිය පිලිබඳ කෙටි සඳහනක් කිරීම හැරුනු කල, එක්සත් ජනපදය තුල ද, ජාත්‍යන්තරව ද, සිදුවෙමින් තිබූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් වල ප්‍රධාන ඒවා පිලිබඳව ස්ටයිනර්ගේ ලිපියේ කිසිදු සඳහනක් නොකෙරුනු තරම් ය. වෛෂයික තත්ත්වයේ මාරුවීම් ද පන්ති අරගලයේ වර්ධනය මත ඒවායේ බලපෑම ද දේශපාලනිකව හා න්‍යායිකව ඒවායේ පරාවර්තනය පක්ෂය තුල සිදු වූ ආකාරය ද අතර සම්බන්ධය ද පරීක්ෂා කිරීමට ඔහුගේ ලිපිය අසමත් විය.

වුල්ෆර්ත් ජාතික ලේකම් තනතුරින් පහ කිරීමෙන් පසුව, 1974 වසරේදී වර්කර්ස් ලීගයට යලි බැඳුනු ස්ටයිනර්, ඒ අවධිය මෙසේ සිහිපත් කලේය. "1974-77 අතර කාලය මා ප්‍රබල න්‍යායික කාර්යයන්හි යෙදුනු අවධියක් විය." එසේ වුව ද, ජාත්‍යන්තර කමිටුව තුල නව ගැටලු පැන නැගෙමින් තිබුනි. කම්කරු විප්ලවවාදී පක්ෂය තුල වර්ධනය වන අර්බුදය පිලිබඳව සාකච්ඡා කිරීමේ දී, ස්ටයිනර් සිය සීමාසහිතකම් පිලිගත්තේය.

> දශක දෙකකට වැඩි කාලයක පසු විපරමක් සහිතව, හීලිගේ 'ඥානනයේ භාවිතය' භෞතිකවාදී අපෝහකයේ ප්‍රතිවාදය වූ බව අවබෝධකර ගැනීම, දැන්නම් මට පහසුය. කව්පයේ වර්ධනය වන අවස්ථාවාදී උපාමාරු සඳහා දාර්ශනික කවරයක් සැපයිය හැකි විවිධ හැඩයන් ගත් ගුඪකරනයන් ව්‍යාපාරය තුලට ඇතුල් කිරීම සඳහා, එය වාහකයක් බවට පත්විය. අවාසනාවකට මෙන් මාක්ස්වාදයේ ඥානය පිලිබඳ න්‍යාය සම්බන්ධයෙන් හීලිගේ ආත්මීය අර්ථ කථනයෙන් මා අපහසුවට පත් වුව ද, මා තුල ඇතිවූ සැක සංකා, මගේම අඩු ලුහුඬුකම් වලට ආරෝපනය කලෙමි.

ස්ටයිනර් නැවතත් දේශපාලන වශයෙන් පාවෙන තත්ත්වයකට වැටීමට වැඩි කලක් ගතවූයේ නැත. "1977-78 කාලය මගේ පුද්ගලික අර්බුදයේ කූටප්‍රාප්තිය වී" යයි ඔහු ලිවීය. ස්ටයිනර්ගේ ලිපියට අනුව, ඔහුගේ දුෂ්කරතා පිලිබඳ දෝෂය අඩු හෝ වැඩි වශයෙන් රැඳී පැවතුනේ මුලුමනින්ම පාහේ වර්කර්ස් ලීගය මතය.

> ...මුලින්ම වර්කර්ස් ලීගයේ එදිනෙදා කටයුතු, න්‍යාය විරෝධී ක්‍රියාවාදය මඟින් වඩ වඩාත් අතික්‍රමනය කල බවක් පෙනෙන්නට තිබුනි. මෙය කව්ප නායකත්වය විසින් ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවලට හඳුන්වාදුන් ව්‍යාජ ඉදිරිදර්ශනයේ ඍජු ප්‍රතිපලය විය. එන්ට එන්ටම අප වැඩ කරගෙන ගියේ සිවිල් යුද්ධයක් ඉතා ආසන්නය යන හැඟීම පෙරදැරිකොට ගෙනය.
> එමනිසා, හැකිතාක් වේගයෙන් අපගේ සාමාජිකත්වය වැඩිකර ගැනීම ඉතා හදිසි කාරනයක් විය. (එය එසේමය.) ව්‍යාපාරයේ කලින් පැවති ප්‍රචාරකවාදී අදියර පිලිබිඹු කරමින් අධ්‍යාපන හා පුහුනු කිරීමේ කටයුතු දැකගනු ලැබුනේ නාස්තිකාරී සුඛෝපභෝගිත්වයක් ලෙසය. සහෝදරවරුන්ට කල නොහැකි කාර්යයන් කිරීමට නියමවූ අතර, මෙය හානිකර ප්‍රතිවිපාක ගෙන දුන්නේය. වුල්ෆර්ත් සිය කඩාකප්පල්කාරී මෙහෙයුම

> ගෙනගිය අවධියේදී මෙන්, පක්ෂ සාමාජිකයන්ගේ පුද්ගලික ජීවිත ඇදහිය නොහැකි තරමේ ආතතීන්ට ලක් කෙරුනි. අප දැන් මුහුන දුන් තත්ත්වය යම් ආකරයකින් 1973-74 අවධියෙහි මුහුන දුන් තත්ත්වයට ද වඩා අයහපත් විය. වුල්ෆර්ත්ගේ අති ධාවනකාරී ක්‍රියාවාදය, පක්ෂය බිඳවැටීමේ අද්දරටම තල්ලු කල අතර, යටත් පිරිසෙයින් ආරම්භයේදී හෝ එය කම්කරු පන්තික තරුනයන් සංඛ්‍යාවක් බඳවාගැනීමේ හැකියාව ඇති කලේය. අන් සියල්ලටත් වඩා මෙය එවකට කම්කරු පන්තියේ පැවති වෙනස් තත්ත්වයන්ගේ ප්‍රතිපලයක් විය. 1973-74 කාලය කම්කරු පන්තියේ බොහෝ ස්ථරයන්හි සටන්කාමිත්වය හා රැඩිකලීකරනය සමඟ සම්පාත වූ අවධියකි. තෙවසරකට පසුව වැඩ වර්ජන රැල්ල හා තරුන රැඩිකලීකරනය නිශ්චිතව ම පිරිහීමට පත් විය. අපගේ වික්‍රමාන්විත ව්‍යායාමයන් තිබියදී වුවත්, මේ කාලයේ නව බලවේගයන් බඳවා ගත්තේ නම් ඒ ඉතා අල්ප වශයෙනි.

සිය අර්බුදයට වගකිව යුත්තා පක්ෂය ලෙස සලකාගත් ස්ටයිනර්ගේ ආත්මීය විස්තරය, 1970 ගනන්වල මැද හා අග භාගය තුල වර්කර්ස් ලීගයේ ඉතිහාසය මුසාකරන තත්වයක් දක්වා විකෘති කලේය. එම අවධියේ පක්ෂයේ ලියවිලි සමාලෝචනය කිරීමේ හා (සතියකට දෙවරක් පලකරන ලද වර්කර්ස් ලීගයේ පුවත්පත වූ ) බුලටින් පත්‍රයේ පලකරන ලද ලියවිලි පරීක්ෂා කිරීමේ පදනම මත, 1974-78 අතර කාල පරිච්ඡේදය කැපී පෙනෙන ලෙස පලදායී එකක් වූ බව පෙන්නුම් කිරීමට අපහසු නොවනු ඇත. කම්කරු පන්තියේ අව්‍යාජ මාක්ස්වාදී පක්ෂයක් වශයෙන් වර්කර්ස් ලීගයේ ඓතිහාසික වර්ධනයේ වඩාත් පුලුල් සන්දර්භය තුල වුල්ෆර්ත් පක්ෂයෙන් ඉවත්වීම, ඔහුම පුද්ගලාරෝපනය කල ඇමරිකානු මධ්‍යම පන්තික රැඩිකල්වාදයේ දේශපාලන ඉතුරුපහදුවෙන් වර්කර්ස් ලීගයේ නිශ්චිත කැඞී වෙන්වීමක ආරම්භය සනිටුහන් කලේය. ඔහුගේ ඉල්ලා අස්වීමෙන් ඉක්බිත්තේ වර්කර්ස් ලීගය, සිය කටයුතු වල සියලු අංග හතරවන ජාත්‍යන්තරයේ ට්‍රොට්ස්කිවාදී උරුමයට අනුකූලව ස්ථානගත කිරීමට අරමුනුකොට ගත්තේය. තමා එසේ පුද්ගලික දුක්ගැනවිලි වලින් සිත පාරාගත් ස්ටයිනර්ට මෙම කේන්ද්‍රීය ජයග්‍රහනය සම්පූර්නයෙන්ම අමතකවූවාක් සේය. මේ අර්ථයෙන් ගත් කල මෙම අවධිය, අංගලක්ෂනය කල දේශපාලන ඉදිරිදර්ශනය පිලිබඳව තීව්‍රව හෝ, ලියොන් ට්‍රොට්ස්කිගේ ඝාතනය වටා පැවති සිදුවීම් පිලිබඳව වර්කර්ස් ලීගයේ මූලිකත්වයෙන් හතරවන ජාත්‍යන්තරය විසින් ඉතිහාසයේ ප්‍රථම වතාවට දියත් කරන ලද ඓතිහාසික පරීක්ෂනය (*ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය* යන මැයෙන් එහි සොයාගැනීම් පලකරන ලදී.) ගැන හෝ ස්ටයිනර්ගේ ලිපියෙහි කිසිදු සඳහනක් නොතිබීම විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු කාරනයකි. **(40)**

බ්‍රිතාන්‍යයේ කම්කරු විප්ලවවාදී පක්ෂය තුල ගැඹුරු වෙමින් පැවති අර්බුදය, වර්කර්ස් ලීගයට දුෂ්කර කොන්දේසි නිර්මානය කලේය. එහෙත් වුල්ෆර්ත්ගේ දේශපාලන පාවාදීමට එරෙහි අරගලය තුලින් වර්කර්ස් ලීගය උකහාගෙන තිබුනු දේශපාලන හා න්‍යායික පාඩම් ද සහ ඉන් පසුව සකල වර්ගයේ අවස්ථාවාදයන්ට එරෙහිව අප පක්ෂය නැවත තියුනු කල අරගලයේ ද, ට්‍රොට්ස්කිවාදය පාවාදුන් කව්ප නායකත්වයට එරෙහි සටන සඳහා පක්ෂය සූදානම් කරනු ලැබිනි.

ස්ටයිනර් මේ වර්ධනයන් පිලිබඳව පෙන්වූයේ අන්ධ බවකි. වර්කර්ස් ලීගය හැර යාමෙන් විසි වසරක් තරම් කාලයකට පසුව, සිය ලිපිය ලියන විට, ඔහුගේ සිහියට නැගුනු බව පෙනී යන්නේ අන් කිසිවක් නොව, සිය පෞද්ගලික දුෂ්කරතාවන් පමනක්ම ය. "ජීවිතය පිලිබඳව මා තුල වූ ඇල්ම ද, පක්ෂ කර්තව්‍යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් මා තුල එතෙක් පැවති උද්යෝගය ද අතුරුදහන්වී ඇතැයි" ඔහු ලිවීය. වර්කර්ස් ලීගයෙන් පිටව යාමට පසුබිම්වූ තත්ත්වයන් ඔහු ඊලඟට සිහිපත් කලේය.

> ...නිසැකව ම මා පිලිබඳව නරකම තත්ත්වය උදා වූයේ 1978 ඔක්තෝබරයේදී ය. දිනක් උදෑසන අපගේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් ගෙන් ලැබුනු දුරකථන පනිවිඩයකින් මම අවදිවීමි. එම පනිවිඩයෙන් කියවුනේ මා වහාම පක්ෂ කාර්යාලයට පැමිනිය යුතු බවයි. කාර්යාලයට පැමිනි මාගේ සිත වැඩකලේ මේ කලබලය කුමක් සම්බන්ධයෙන් ද යන්න මත බව මාගේ සිහියට නැඟෙයි. ඉන්පසු පෙරදින රාත්‍රියේ තරුන රංගනයකට සහභාගීවූ ටොම් හෙනහන් සහෝදරයා මරා දමන ලදැයි යන සිත් කම්පා කරවන ප්‍රවෘත්තිය මට දැනගන්නට ලැබුනි. එවන් ප්‍රවෘත්තියක් ඇසීමට මා කිසිම සූදානමකින් පසු නොවූයෙමි....
>
> ඊලඟ සති හා මාස කිහිපය තුල මා සිටියේ දේශපාලනිකව පාවෙන තත්ත්වයක ය. එක් දිනයක, ඒ කවදාදැයි මාගේ මතකයෙහි පවා නැත; මම ව්‍යාපාරය හැර ගියෙමි.

ටොම් හෙනහන්ගේ අභාවය ස්ටයිනර් තුල කම්පනයක් ඇතිකල බවට සැක කිරීමට හේතුවක් නැත. එහෙත් ඔහුගේ විස්තරය තුල, කරුනු කාරනා වශයෙන් එක් ප්‍රධාන දෝෂයක් ගැබ්ව තිබුනි. ටොම් හෙනහන් ඝාතනය කරනු ලැබුවේ 1978 ඔක්තෝබරයේ නොව හරියටම ඊට වසරකට පෙරාතුව, 1977 ඔක්තෝබරයේ ය. මේ පරස්පරය වැදගත්ය. මන්ද යත්, ස්ටයිනර් වර්කර්ස්

ලීගයෙන් පිටව යාම පිලිබඳව විස්තරයක් ඉදිරිපත් කිරීම තුල, තමා විප්ලවකාරී දේශපාලනය අතහැර දැමීම පිලිබඳ සැබෑ තත්ත්වයන් විකෘති කර ඇති බැවින්ය. **(41)** ඇත්ත වශයෙන්ම ස්ටයිනර්ගේ පලායාම ඉක්මන් කලේ කෙලින්ම ටොම් හෙනහන්ගේ අභාවය නොවේ. ඒ වෙනුවට එය කඩිනම් කලේ, හෙනහන්ගේ අභාවයෙන් මාස ගනනාවකට පසුව වර්කර්ස් ලීගය, පක්ෂයේ දේශපාලන මධ්‍යස්ථානය ඩෙට්‍රොයිට් වෙත ගෙනයාමට ගන්නා ලද තීරනය මඟිනි. පක්ෂයේ දේශපාලන කේන්ද්‍රස්ථානය වෙනත් තැනකට මාරුකිරීමෙන් අරමුනු කලේ, මිඩ්වෙස්ට්හි පිහිටි වැදගත් කාර්මික මධ්‍යස්ථානයන්හි කම්කරු පන්තියේ අරගල තුල පක්ෂයේ මැදිහත්වීම හා සම්බන්ධය ශක්තිමත් කිරීමය. මේ කරුන ගැන ස්ටයිනර්ගේ ලිපියෙහි කිසිදු සඳහනක් නොවීය. 1978 වසරේ වසන්ත සමයේ ඇරඹුනු පක්ෂ මධ්‍යස්ථානය යලි ස්ථානගත කිරීමේ මෙම සූදානම, නව ඉදිරිදර්ශන යෝජනාව කෙටුම්පත් කිරීම පිලිබඳ බැරෑරුම් කර්තව්‍යයන් සමඟ බැඳී තිබුනි.

පක්ෂ මධ්‍යස්ථානය මිඩ් වෙස්ට්හි යලි ස්ථානගතකිරීම හා එහි කටයුතු ප්‍රති සංවිධානය කිරීමේ දී මතුවූ සිය පෞද්ගලික ප්‍රශ්න වලින් ස්ටයිනර් චංචල විය. ඔහු අනුගතව සිටියේ නිව් යෝර්ක් නගරයේ රැඩිකල් මධ්‍යම පන්තික සමාජ පරිසරයටය. නව පක්ෂ මධ්‍යස්ථානය ඩෙට්‍රොයිට්හි ස්ථාපිත කිරීම, පක්ෂයේ සමාජ නැඹුරුවෙහි වෙනසක් ඇති කිරීමටත්, කම්කරු පන්ති අරගල තුල වඩාත් සමීප ලෙස දිනපතා මැදිහත් වීමටත් අවස්ථාව සලසනු ඇතැයි ඔහු අවබෝධ කර ගත්තේය. සිය ජීවන රටාවේ වෙනසක් ඇතිකිරීමට තුඩුදිය හැකි මෙම කටයුතු ඔහුගේ සතුටට හේතු නොවීය. නිව් යෝර්ක් නගරය හැරයාමට ස්ටයිනර් බැඳී නොසිටිය ද, පක්ෂ මධ්‍යස්ථානය වෙනත් තැනක පිහිටුවීම පිලිබඳ ඔහුගේ කනස්සල්ල හා පක්ෂයේ ඉදිරිදර්ශනය සමග ඔහුට පැවති මතභේද ඒ තුලින් මනාව පෙන්නුම් කරයි. 1978 ශරත් සමයේ පක්ෂ මූලස්ථානය යලි පිහිටුවීමේ මූලික කටයුතු අවසන් වෙත්ම ස්ටයිනර් ව්‍යාපාරය හැර ගියේය. **(42)**

අවසාන විග්‍රහයේදී ස්ටයිනර් විප්ලවකාරී දේශපාලනයෙන් සමු ගැනීම, මූලිකව ගත් කල මධ්‍යම පන්තික සමාජ හුරුවක ප්‍රකාශනයක් වීය යන කාරනය, 1985 වසරේ ජාත්‍යන්තර කමිටුව තුල පිපිරුනු අරගලයට ප්‍රතිචාර වශයෙන් ස්ටයිනර් ඉදිරිපත් කල විස්තරයෙන් සනාථ විය. ඔහු මෙසේ ලිවීය:

> මෙම සිදුවීම් පසුගිය අට වසර තුල සිදුවූ අන් කිසිවකට වඩා මා ප්‍රානවත් කලේය. ජාත්‍යන්තර කමිටුව තුල සිදුවූ වර්ධනයන් මා නිරීක්ෂනය කලේ උනන්දු සහගතව යයි කිවහොත් එය මූලිකව ම අඩු තක්සේරුවකි. මට ලැබුනු සෑම තොරතුරු බිඳක්ම මම ජීරනය කර ගත්තෙමි. මම අලුතින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කමිටුවේ ක්‍රියාකාරී ආධාරකරුවෙක් වීමි.

ජාත්‍යන්තර කමිටුව තුල අරගලය "ගෙන යන ලද්දේ දේශපාලන ඉදිරිදර්ශන පිලිබඳ ඉතා ආසන්න මතභේද මුල්කරගෙන නොව, මාක්ස්වාදී න්‍යායේ වඩා පුලුල් ප්‍රශ්න මතය" යනුවෙන් ස්ටයිනර් සිය ලිපිය තුල සඳහන් කලේය. එසේ වුව ද න්‍යායික මතභේදවල හරය පිලිබඳව ඔහු කිසිදු සඳහනක් නොකලේය. ව්‍යාපාරය තුල ස්ටයිනර්ගේ ඉතිහාසය සලකා බලන විට මෙය මූලික මඟහැරීමකි. විශේෂයෙන්ම භෞතිකවාදී අපෝහකය පිලිබඳ හීලිගේ විකෘත කිරීම් ගැන ජාත්‍යන්තර කමිටුවේ පුලුල් විවේචන ගැන ඔහුට කීමට කිසිවක් නොමැතිවීම මවිතකරවන සුලු යයි දේශපාලන කමිටුවේ සාමාජිකයන්ට හැඟී ගියේය. හීලිගේ "ඥානනයේ භාවිතය" ගොඩනගන ලද්දේ මාක්ස්වාදය පිලිබඳ විඥානවාදී සංශෝධනයක් මත පදනම්ව ය යන්න එම විවේචනයේ මූලික ගාමකය විය. මේ ලිපිය ලියන 1999 වසරේදී එම කාරනය සමඟ එකඟ නොවීම හේතුකොට ගෙන එය මඟහැරීමට ස්ටයිනර් තීරනය කල බවට ඇතිවන සාධාරන සැකය කෙනෙකුට ඉවත දැමිය නොහැකිය.

"නැවත වරක් ව්‍යාපාරයට සම්බන්ධ වීමට තමා පොලඹවන ලද බව" ස්ටයිනර් ප්‍රකාශ කල ද ජාත්‍යන්තර කමිටුව විසින් ගෙන යන ලද අරගලය සමඟ සිය එකඟත්වය තිබිය දී ම ස්ටයිනර්, අවසානයේදී පක්ෂයෙන් පිටත සිටීමට තීරනය කලේය. සසප දේශපාලන කමිටුව වෙත ඔහු ඉදිරිපත් කල පැහැදිලි කිරීම ඇදහිය නොහැකි තරම් අව්‍යාජ එකක් විය.

> අවසානයේදී සසප සාමාජිකයෙකු වීම වෙනුවට පක්ෂයේ ආධාර කරුවෙකු ලෙස සිටීමට මම තීරනය කලෙමි. එසේ කිරීමට මා පොලඹවන ලද කරුනු සංකීර්න වූ අතර, ඒවා පැහැදිලිව ප්‍රකාශ කිරීම ලේසි නැත. ඇත්ත වශයෙන්ම මේ මොහොත වන තුරුම එම හේතු සවිඥානකව විශ්ලේෂනය කිරීමට මා කිසිදු උත්සාහයක් දරා ද නැත. මා පොලඹවන ලද්දේ අවස්ථාවන් කිපයක සංයෝජනයක් මඟින් යයි මම විශ්වාස කරමි. පලමුවෙන්ම, මා ව්‍යාපාරය තුල කලින් ලැබූ අත්දැකීම් වලින් ලත් තුවාල සුව කිරීමේ කාර්යයෙහි මම තවමත් නිරතව සිටිමි. මා කලින් අත්දුටු දේශපාලනික අවමංගතවීම, 1977-78 කාලයේ පටන් මාගේ පෞද්ගලික සිත් තැවුල් සමඟ මුලුමනින්ම එකට වෙලී තිබුනි. ඊට අමතරව මා විසින්ම සොයාගත් අලුත් නවාතැන් පලක් ද පැවතුනි. 1980 ගනන් මැද භාගය වන විට වෘත්තීයමය වශයෙන් මම, සාර්ථක නව නැවතුම් පොලකට අවතීර්නව සිටියෙමි. මම සුව පහසු මධ්‍යම පන්තික ජීවන රටාවකට

ඇතුල් වී තිබුන අතර, ස්වයං මගහැරීමේ සියලු ප්‍රයත්නයන් එසේ තිබියදී වුවත්, එය කඩාකප්පල් වනු දැකීමට මාගේ කැමැත්තක් නොතිබූ බව මම දැන සිටියෙමි.

ව්‍යාපාරය සමග දේශපාලනික සහයෝගීතාවයන් පැවතියේදී වුවත්, මාගේ එදිනෙදා ජීවිතය විප්ලවකාරී සමාජවාදයේ උත්සුකයන්ගෙන් බෙහෙවින්ම දුරස්ත වී තිබුනි. මම මධ්‍යම පන්තික නිව් යෝර්ක් සංස්කෘතියේ කොටස්කරුවෙකු වීමි.

තමන්ගේ ස්වයංතෘප්ත හා මූලිකවම තත්වාරක්ෂක සුලු ධනේශ්වර දෘෂ්ටිය පිලිබඳ ස්ටයිනර්ගේම පිලිගැනීම මධ්‍යයේ, ඊට අලුතින් එකතු කිරීමට යමක් නැති තරම්ය. එම පිලිගැනීම ම ප්‍රමානවත්ය. පක්ෂයෙන් පිටත හිඳීම යුක්ති සහගත කරන ඔහුගේම කරුනු දැක්වීම, 1999 අගෝස්තු මාසයේ සසප වෙත ලිපියක් ලියන අවස්ථාව තෙක්ම සමාලෝචනය කිරීමට සැබවින්ම කිසි දිනෙක උත්සාහයක් නොදැරූ බවට ඔහුගේම පිලිගැනීම මගින් කෙනෙකුට කලබලයට පත් නොවී සිටිය නොහැකිය. ඒ අවස්ථාව වන විට, 1985 ජාත්‍යන්තර කමිටුවේ භේදයෙන් වසර 14 ක් ගතවී තිබුනි. එම දිගු කාලය තුල ඔහුගේ මොලයෙන් ගෙන ඇත්තේ කුමන ප්‍රයෝජනයක් දැයි යමෙකු විමසිය යුතුය. **(43)**

ස්ටයිනර්ගේ ලිපියේ අවසන් කොටස, පක්ෂයේ වැඩ කටයුතු ගැන ඉමහත් ප්‍රශංසාවන්ගෙන් පිරී තිබේ. දැනට පවත්නා දේශපාලන හා සමාජ පරිසරයේ "කුනුවූ වතාවරනය" හා එහි සමාජ වටපිටාව අතර වෙනස සසඳ බලන විට, තමා සහභාගී වූ මහජන රැස්වීම් ඔහු විස්තර කලේ "නැවුම් වාතාශ්‍රයේ සුසුමක්" ලෙසය. නඩෙස්ඩා ජොෆේ හා වාඩිම් රොගෝවින් සමඟ පැවති හමුවීම් සිහිපත් කල ඔහු සඳහන් කලේ, "එවැනි පුද්ගලයන් සිටීම ම, ආත්ම උන්නතියේ සංස්කෘතිය තෝරාගත් අය කරදරකාරී ලෙස අපහසුවට පත්කරන්නක්" බවය. ස්ටයිනර් මත මෙතරම් ප්‍රගාඪ බලපෑමක් ඇති කල මෙම හමුවීම් සිදු වූයේ 1995 වසරේදීය. සිද්ධීන් සම්බන්ධ ස්ටයිනර්ගේ මෑතම ප්‍රකාශන වලට අනුව, මෙය දල වශයෙන් පක්ෂයේ දේශපාලන පිරිහීමේ මැද අවධිය විය.

පක්ෂයේ ක්‍රියාකාරීකම්වලට සහභාගීවීම මගින් තමා කෙරේ ඇතිවූ බලපෑම ස්ටයිනර් මෙසේ විස්තර කලේය.

> දර්ශනවාදය පිලිබඳව මාගේ උන්න්දුව යලි පුබුදුවාලීමට මේ මඟින් ආවේශය සැපයුනි. 1996 යම් කාලයකදී මම හේගල්, මාක්ස් හා බටහිර දර්ශනවාදයේ සමස්ත සම්ප්‍රදාය ම පිලිබඳ පෘථුල අධ්‍යයනයක යෙදුනෙමි. තවද, මාගේ මෑත ජීවන චරිතාපදානයේ මෙම කාල පරිච්ඡේදය, ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩනැගීම හා වර්කර්ස් ලීගය සමාජවාදී සමානතා පක්ෂය බවට පරිවර්තනය කිරීම සමග සම්පාත වීම ඇතැම් විට මුලුමනින්ම අහඹු සිදුවීමක් නොවන්නට ඇත. කෙසේ වුව ද මෙම සහසම්බන්ධය යමෙකු කුමන ආකාරයකට පැහැදිලි කල ද මම, නව ගෝලීය සංනිවේදන මාධ්‍ය තුලින් සන්නද්ධ කල හැකි විභවය අවබෝධකර ගැනීමට පටන් ගතිමි.

සිය ලිපියේ අවසානයට ලඟාවත්ම ස්ටයිනර්, ටොම් හෙනහන් ඝාතනයේ 20 වන සංවත්සරය සැමරීම සඳහා කැඳවන ලද පක්ෂ රැස්වීමේ ඉමහත් බලපෑම අවධාරනය කලේය. ඔහු මෙසේ ලිවීය. "ව්‍යාපාරයේ කර්තව්‍යයන් සඳහා මගේ දායකත්වයේ මට්ටම ඉහල මට්ටමකට නැංවීමට මා කැපවූයේ එවිටය. යම් ආකාරයකට ලේඛන කලාව අතින් දායක වීමට මම අදහස් කලෙමි. එහි නිශ්චිත හරය තවමත් නිර්නය වී තිබුනේ අපැහැදිලි ආකාරයකිනි."

අවසානයේදී ස්ටයිනර් මෙසේ ප්‍රකාශ කලේය.

> මා ඉටුකිරීමට කැමති වන්නේ සමාජවාදය සඳහා අරගලය තුල සහභාගී වන්නෙකුගේ භූමිකාව බව මම දැන් අවබෝධ කරගෙන ඇත්තෙමි. න්‍යාය භාවිතයට යෙදීමට අඩු යමක් මට තෘප්තියක් ගෙන නොදෙනු ඇත. නිදහසේ සැබෑ සාරය එයයි.

ස්ටයිනර්ගේ ලිපිය සසප දේශපාලන කමිටු සාමාජිකයන් අතර ප්‍රශ්න ගනනාවක් මතු කලේය. 1970 ගනන් වල වර්කර්ස් ලීගයේ ඉතිහාසය පිලිබඳ ඔහුගේ තක්සේරුව සම්බන්ධයෙන් තියුනු ප්‍රශ්න මතු විය. පක්ෂයේ වෛෂයික අත්දැකීම් සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රවේශය හෙලි කලේ අන්ත හා මංමුලා සහගත ආත්මීයවාදයකි. ඔහු සඳහන් කල සිද්ධීන් සම්බන්ධයෙන් වඩාත්ම ඔහුගේ මතකයට නැගුනු බව පෙනී ගියේ ඇලෙක්ස් ස්ටයිනර්... මත ඒවා ඇති කල බලපෑමයි! තවද, කම්කරු විප්ලවවාදී පක්ෂය තුල ගැටුම පිලිබඳ ඔහුගේ තක්සේරුව -ජාත්‍යන්තර කමිටුවේ භූමිකාව සම්බන්ධයෙන් ඔහුගේ උනුසුම් ප්‍රශංසාව මධ්‍යයේ වුව ද - නොගැඹුරු එකක් විය. 1970 ගනන් වල වුල්ෆර්ත් සමඟ ද 1980 ගනන් වල කව්ප නායකත්වය සමඟ ද පැවති මතභේදවල හරිමැද තිබූ දේශපාලනික හා න්‍යායික ගැටලු සම්බන්ධයෙන් ස්ටයිනර් ප්‍රවේශමෙන් හා ක්‍රමානුකූලව සිතා බලා නිගමනයකට පැමිනි බවට දේශපාලන කමිටුවට ඒත්තු ගියේ නැත. ස්ටයිනර් අධෛර්යයට පත්කිරීමට දේශපාලන කමිටුව කැමති නොවූව ද ඔහු සසපයට

යලි බඳවා ගැනීමට තවමත් කාලය පැමින නැතැයි හැඟීගොස් තිබුනි. තව දුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍ය වනු ඇත.

### (vii) 2000 පෙබරවාරි මාසයේ පැවති සසප සාමාජික රැස්වීම හා හයිඩෙගර් පිලිබඳ ස්ටයිනර්ගේ ලිපි

අනාගතයේ යම් දිනක ස්ටයිනර්ගේ ඉල්ලුම් පත්‍රය පිලිගැනීමේ හැකියාව සම්බන්ධයෙන් දොර වැසේය යන නිගමනයට ඒමට ඔහුට ඉඩ තැබීම ගැන මගේ කැමැත්තක් නොතිබූ හෙයින්, දේශපාලන කමිටුවේ තීරනය පිලිබඳව ඔහු සමග සෘජුව ම කථා කිරීමට මම වැඩි මනාපයක් දැක්වීමි. කාර්ය බහුලත්වය නිසා මාස ගනනාවකට ස්ටයිනර් සමඟ හමුවක් සඳහා කටයුතු කිරීමට මට හැකියාවක් නොතිබින. එසේ වුව ද, සාකච්ඡාවක් සඳහා වඩාත්ම හිතකර වාතාවරනයක් සැකසීම සඳහාත්, අනාගත සහයෝගීතාවය වෙනුවෙන් ප්‍රතිපත්තිමය පදනමක් ගොඩනැඟීම පිලිබඳ සසප යේ අව්‍යාජ උනන්දුව පෙන්නුම් කිරීම සඳහාත්, ඩෙට්රොයිට්හි පැවැත්වීමට නියමිත ජාතික සාමාජිකත්ව රැස්වීමට නිරීක්ෂකයෙක් ලෙස සහභාගී වන මෙන් මම ස්ටයිනර්ට ආරාධනා කලෙමි. මගේ ආරාධනය පිලිගත් ඔහු, 2000 පෙබරවාරි 12 වන දින රැස්වීමට සහභාගී විය.

මා පල කල අදහස් ස්ටයිනර්ගේ ප්‍රයෝජනය සඳහා සූදානම් කල ඒවා නොවුව ද, ඉක්ම ගිය ජූනි මාසයේ ලිපියෙන් ස්ටයිනර් මතු කල න්‍යායික මතභේද වලට අතිශයින් අදාල වූ කරුනු කෙරෙහි අවධානය යොමු විය. මගේ වාර්තාවේ ආරම්භක කොටසෙහි මම මෙසේ කියා සිටියෙමි.

> 20 වන සියවස දැන් අවසානයකට පැමින තිබේ. එනමුදු එහි උරුමයෙන් එතරම් ඉක්මනින් අපට ගැලවීගත නොහැකිය. නව සියවසේ කැලඹීම් වලට අපගේ දේශපාලන සූදානමේ සාරභූත සංරචකය සමන්විත වන්නේ, 1900 ගනන්වල ඉතිහාසය වෙහෙස නොබලා සමාලෝචනය කිරීමෙන් හා උකහා ගැනීමෙනි. මෙසේ උකහා ගැනීමට අන්තර්ගත වනු ඇත්තේ හුදෙක් කරුනු කාරනා එක්රැස් කිරීම පමනක් නොව - වඩාත් ප්‍රගාඪ ලෙස - ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ න්‍යායික පදනම් සැදුම් ලත්, මහා බුද්ධිමය ජයග්‍රහන ආරක්ෂා කිරීම හා යලි තහවුරු කිරීමයි.
>
> මේවා අතුරින් වඩාත් තීරනාත්මක ජයග්‍රහනය වනුයේ, මානව සමාජ-ආර්ථික සංවර්ධනයේ නියාම පැවත එන ස්වභාවය පිලිබඳ මාක්ස්වාදී එනම්, ඓතිහාසික භෞතිකවාදී සංකල්පයයි. මේ තුලින්, මාගේ අභිප්‍රාය වන්නේ - දෙවැනි ජාත්‍යන්තරයේ විධිමත් න්‍යායාචාර්ය වරුන්ගේ ක්‍රමවේදය අනුව යමින් - පුරෝකථනය කල හැකි අනු පිලිවෙලකට ඉතිහාසය දිග හැරීමේ යාන්ත්‍රික සංකල්පයක් යලි ගොඩනැඟීම නොවේ. ඓතිහාසික භෞතිකවාදය පිලිබඳ මේ ආකාරයේ හෙලි දැක්වීම් දෙවන ජාත්‍යන්තරයේ බුද්ධිමය වටපිටාව තුල පිලිබිඹු වූයේ, දේශපාලන අනුක්‍රමිකවාදයෙන් අධිකාරවත් වූ පරිසරයක පීඩනය යටතේ, මාක්ස්ගේ ප්‍රගාඪ අපෝහකවාදී සංකල්පයන්ගෙන් න්‍යායිකව පසු බැසීමක් ලෙසය. **(44)** මාක්ස්වාදයේ ඓතිහාසික නියතිවාදය සමන්විත වන්නේ කිසියම් සිද්ධියක "අනිවාර්ය බව" අමු අමුවේ තහවුරු කිරීමෙන් නොවේ. ඒ වෙනුවට, සමාජ පැවැත්ම වෛෂයික විද්‍යාවේ ප්‍රවර්තනයන් බව එය තරයේ කියා සිටියි.

මාක්ස්වාදී න්‍යායේ අති මූලික කරුනු යලි ප්‍රකාශ කිරීම අවශ්‍යවන්නේ ඇයි ද පැහැදිලි කරමින් මම මෙසේ කියා සිටියෙමි:

> මාක්ස්වාදයට එරෙහි සමකාලීන ප්‍රහාරයේ දාර්ශනික හරය වන්නේ, ඓතිහාසික අවශ්‍යතාවය පිලිබඳ සංකල්පය ප්‍රතික්ෂේප කිරීමයි. ඔක්තෝබර් විප්ලවයට ඓතිහාසික සුජාත භාවයක් ඇතැයි ප්‍රකාශ කිරීම පදනම් විරහිත යයි එය අවධාරනය කරයි. සමාජ විප්ලවය අවශ්‍යයෙන්ම සමාජ ආර්ථික ක්‍රියාවලීන්ගේ තර්කනයෙන්ම පැනනැඟුනේය යන බෝල්ශෙවික් ප්‍රකාශය හෙලා දකිමින්, මාක්ස්වාදයේ විරුද්ධවාදීන් අවධාරනය කරන්නේ, එය අසාමාන්‍ය සිදුවීමක් යනුවෙනි. හුදෙක්ම අනර්ථකාරී අභිප්‍රායන් හා විශේෂිත අවස්ථාවන් එකිනෙක මත ක්‍රියාකිරීමේ නිමැවුමක් වූ අහඹු සිද්ධියක් බවය....
>
> දැන් පලවන ඓතිහාසික ලිපි ලේඛන තුල, පශ්චාත් නූතනවාදීන්ගේ කෘතීන්හි මෙය වඩාත් සුවිශේෂී වන අතර, අවශ්‍යතාවය මත එල්ල කරන මෙම ප්‍රහාරයේ න්‍යායික පදනම කවරේ ද? 19 වන සියවස තරම් ඈතට දිවෙන, ධනේශ්වර චින්තනයේ ප්‍රධාන ප්‍රවනතාවක් එය උච්ඡාරනය කරයි. එනම්, හේගල් හා ඉන් පසුව මාක්ස්ගේ චින්තනයේ විප්ලවකාරී ඓතිහාසික හා සමාජීය ගම්‍යයන්ට එරෙහිව - කීර්කිගාඩ්, ෂෝපන්හොවර් හා නීට්ෂේගේ සිට හයිඩෙගර් දක්වා වූ - දක්ෂිනාංශික ප්‍රතිගාමීත්වයයි.

20 වන සියවස තුල ධනේශ්වර චින්තනයේ ප්‍රධාන ප්‍රවනතාවන්ට මාක්ස්වාදී භෞතිකවාදය හතුරු විරුද්ධත්වයක් වූ බව මම අවධාරනය කලෙමි. "නියාම පාලිත ඓතිහාසික ක්‍රියාවලියක් පිලිබඳ සංකල්පයට ප්‍රතිවිරුද්ධව, ධනේශ්වර දර්ශනවාදය පවතින්නේ යයි උපකල්පනය කරන්නේ, සාරභූතවම අහේතුක ලෝකයකි. මේ ලෝකය තුල සිය සුවිශේෂී අනන්‍යතාවය අනාවරනය කර ගෙන තහවුරු කිරීම සඳහා කුඩුපට්ටම්වූ පැවැත්ම මංමුලාගතව පොරබදති" යි මම සටහන් කලෙමි. 20 වන සියවස තුල දාර්ශනික අහේතුකවාදයේ ප්‍රකාශකයින් අතර වඩාත්ම කැපී පෙනෙන අයෙකුවූ මාටින් හයිඩෙගර්ගේ ලියවිලි වෙත ඉන් පසුව මම අවධානය යොමු කලෙමි.

මගේ ආරම්භක අදහස් දැක්වීම අවසන් කරමින් මම මෙසේ කියා සිටියෙමි. "දේශපාලන හා සමාජීය ඉදිරිදර්ශනය පිලිබඳ සියලු තීරනාත්මක ප්‍රශ්නවලට ක්‍රමානුකූලව පිලිතුරු සපයාගත හැක්කේ, ඉතිහාසය පිලිබඳ අවබෝධයක පදනම මත පමනක් බවත්, - සැබවින්ම, වඩාත් ඍජු ලෙස 20 වන සියවසේ ඉතිහාසය මත පදනම්ව - නමුත් ඊටත් ඔබ්බටත්, සොබාදහම තුලින් පැන නැගුනාවූ සමාජ පැවැත්මේ සම්පූර්න නියාම පාලිත ස්වභාවයේ පදනම මතය. ඉන් පසුව මම, 1922 වසරේ ට්‍රොට්ස්කි ලිවූ පොතකින් උපුටා දැක්වීමි.

> භෞතිකවාදී ලෝක දෘෂ්ටිය සමස්ත විශ්වයටම කවුලුවක් විවෘත කරනවා පමනක් නොව, අධිෂ්ඨානය ද ශක්තිමත් කරයි. සමකාලීන මිනිසා මිනිසෙක් බවට පත්කරන එකම දෙය ද එයයි. ඔහු තවමත් දුෂ්කර ද්‍රව්‍යමය කොන්දේසි මත රැඳී සිටින බව සැබෑය. එහෙත්, ඔහු දැනටමත් ඒවා ජය ගත හැක්කේ කෙසේදැයි වටහාගෙන සිටියි. ඉහලම තාක්ෂනික කෞෂල්‍යය ද ඉහලම සහයෝගිතාවය ද මත එකවිටම පිහිටා ගනිමින් නව සමාජය ගොඩනැගීමේ කාර්යයට ඔහු සවිඥානකව උරදෙයි. (එදිනෙදා ජීවිතයේ ගැටලු - *Problems of Everyday Life* - 272 පිටුව)

මා කල මත ප්‍රකාශ සමඟ එකඟ නොවූ බවක් ස්ටයිනර් ඇඟවූයේ නැත. එයට පටහැනිව, ඔහුට සභාව ඇමතීම සඳහා ආරාධනය කල විට, මාගේ ප්‍රවිෂ්ටය සමඟ ස්ටයිනර් තමන්ගේ දැඩි එකඟතාවය පල කලේය. **(45)** සසප රැස්වීමේදී මතුකරන ලද දාර්ශනික ගැටලු තුලින් පැන නගින පරිදි, මාටින් හයිඩෙගර්ගේ ජීවිතය වටා ගොඩනැගුනු මතභේදය පැහැදිලි කරමින්, විශේෂයෙන්ම ඔහුගේ අහේතුකවාදී දර්ශනය හා නාසිවාදීන් බලයට පත්වීමෙන් පසුව ඔවුන් කෙරේ දැක්වූ සහයෝගය අතර සම්බන්ධය අලලා, ලිපිපෙලක් ලියන ලෙස මම ස්ටයිනර්ට ඇරයුම් කලෙමි. මේ ලිපි ගැන ස්ටයිනර්-බ්‍රෙනර් කිහිප විටක්ම සඳහන් කර තිබුන ද ඒවා බිහිවූයේ කවර පසුබිමක් යටතේ දැයි සඳහන් කිරීමට ඔවුහු අපොහොසත් වූහ. ස්ටයිනර්ට මේ කාර්යය පැවරීමට යෝජනා කිරීමේ දී මා තුල යටි අරමුනක් තිබූ බව හෙලිකල යුතුය. හයිඩෙගර්ගේ ආත්මීය විඥානවාදය සමඟ පොරබැදීමේදී ස්ටයිනර්ට, ඔහු ලෝසවෙඅ දර්ශනවාදී අංශය වෙනුවෙන් කල සිය කෙටුම්පත් ප්‍රකාශනයේදී මෙන්ම 1999 ජූනි මස ඔහුගේ ලිපිය තුලින් ද භෞතිකවාදය කෙරේ පලකරන ලද දාර්ශනික මත ගැටුම ජය ගැනීමට මෙය ආධාරකයක් වනු ඇතැයි මම කල්පනා කලෙමි. ස්ටයිනර්ගේ ලිපි 2000 අප්‍රේල් මුලදී පලකරන ලදී.

ජාතික සාමාජිකත්ව රැස්වීමට ඉදිරිපත් කරන ලද වාර්තාවේ හා ඉන් අනතුරුව ඇතිවූ සාකච්ඡාවල බලපෑම පැහැදිලිව පිලිබිඹු කල මේ ලිපි, සසප සමඟ ස්ටයිනර්ගේ සහභාගිත්වයෙහි උච්ඡතම අවස්ථාව නිරූපනය කලේය. අවසන් ලිපියේ අවසන් කොටසෙන් උපුටා දැක්වීම වටනේය.

> වාම නැඹුරුවක් සහිත බුද්ධිමතුන් විසින් හයිඩෙගර් වැලඳ ගැනීම, පශ්චාත් යුද කාලපරිච්ඡේදයේ වඩාත්ම කුතුහලය දනවන දාර්ශනික ප්‍රවනතාවන්ගෙන් එකක් බවට පත්ව තිබේ. මෙය අසාමාන්‍ය ලෙස සංකීර්නවූ විෂයකි. මේ පිලිගැන්වීමේ පරිමානය තුල, එය සම්පූර්නයෙන් ඉදිරිපත් කිරීමට අපට පුලුවන් කමක් නැත. ඓතිහාසික වෙනස්කම් තිබිය දී ම අප හුදෙක්ම කැමැත්ත දක්වන්නේ හයිඩෙගර් හා ඔහුගේ සමකාලීන අනුගාමිකයන් අතර ඥානවිභාගී ලේ නෑකම පිලිබඳ දල සටහනක් ඉදිරිපත් කිරීමට ය.
>
> බටහිර රටවල පශ්චාත් යුද කාලපරිච්ඡේදයේ බුද්ධිජීවීන්ගේ අංගලක්ෂනය වන්නේ, මාක්ස්වාදය, මානවවාදය හෝ පුනර්ජීවන හේතුවාදයෙහි බිංදුමාත්‍රයක් සමඟ හෝ පැවති සියලු බැඳීම් මුලුමනින්ම අතහැර දැමීම ය. රැඩිකල් බුද්ධිමතුන් පරම්පරාවකගේ අපේක්ෂාවන්, 1960 ගනන්වල අග භාගයේ හා 1970 ගනන් වල මුල භාගයේදී අසාර්ථක වූ විප්ලවකාරී ව්‍යාපාරවල බරින් තැලී පොඩිවී ගියේය. විශේෂයෙන්ම 1968 මැයි ජූනි විප්ලවකාරී නැඟිටීම්වල අසාර්ථකත්වය ප්‍රන්ස බුද්ධිජීවීන් මත එල්ල කල බලපෑම අවතක්සේරු කිරීමට පහසු නොවනු ඇත. කලින් වාම බුද්ධිමතුන්ව සිටි බොහෝ පිරිස්, හේතුවාදී විමුක්තිදායකයෙකු පිලිබඳ පුනරුදයේ දෘෂ්ටියෙන් මුලුමනින්ම පසුබැසීමට පටන් ගත්හ.

අප යුගයේ වර්තමාන බිහිසුනු ඉතිහාසය වටහා ගැනීමේ ප්‍රයත්නය අසාර්ථක වී යයි නිගමනය කල පශ්චාත්නූතනවාදීන්ට, පුනරුදයට පිටුපෑ අහේතුකවාදී සම්ප්‍රදාය තමන් සතු කර ගැනීම අමාරු දෙයක් වූයේ නැත. හයිඩෙගර්වරුන්, පශ්චාත්නූතනවාදීන්, විසංයෝජනවාදීන් හා නව තත්කාර්යවාදීන් පොදු එකඟතාවයකට පැමිනෙන්නේ මෙතැනදීය. "දර්ශනවාදය" හෝ "විද්‍යාව" යනුවෙන් ලොකු අකුරෙන් දක්වන, තමන් විසින් සම්ප්‍රදායික සංකල්පිත චින්තනය ලෙස හඳුන්වන දෑ, මේ සියලු ප්‍රවනතාවන් විසින් ප්‍රතික්ෂේප කරති.

ස්ටයිනර් මෙය මැනවින් කියා තිබේ. එහෙත් මෙම ලිපිවලින් හෙලා දකින ලද එම ස්ථාවරයන්ම වැලඳ ගැනීමට ඔහුට වැඩි කලක් ගතවූයේ නැත. **(46)**

## (viii) ජෙෆ් ගෝල්ඩ්ස්ටයින්ගේ අභාවය

හයිඩෙගර්ගේ ලිපි පලකිරීමෙන් විදහා දැක්වුනු පරිදි, අපෝහක භෞතිකවාදය වෙනුවෙන් අරගලය ඉදිරියට ගෙන ගිය ස්ටයිනර්ගේ ලිපි පලකිරීමට ලෝසවෙඅ කැමැත්තකින් පසුවිය. දේශපාලනික හා න්‍යායික මතභේද තිබියදී වුව ද, එකමුතුව වැඩකිරීමට බරපතල හා අඛන්ඩ ප්‍රයත්නයක් දරන ලද බව අපගේ වාර්තාවෙන් පෙන්නුම් කෙරෙයි. එසේ වුව ද, ස්ටයිනර්ගේ සමාජ හැඩගැස්ම මඟින් මෙම ප්‍රයත්නයන් අවුල් කෙරිනි. මාක්ස්වාදය පිලිබඳ ඔහුගේ උනන්දුව බොහෝ කොටම වියුක්ත ස්වභාවයක් ගත්තේය. ඔහුගේ භාවිතය හා දෘෂ්ටිය අතින් ගත් කල එය, ඔහු 1970 ගනන්වල වර්කර්ස් ලීගයට බැඳීමට පෙරාතුව පැවති තත්ත්වයෙන්ම තිබුනි. එනම්, වාම සුලු ධනපති බුද්ධිමතෙකු ලෙසය. පොදුවේ සුහද සහයෝගීතාවයකින් කටයුතු කල අවධීන්හිදී ද, පන්ති හා දේශපාලන දිශානතිය පිලිබඳ මූලික ප්‍රශ්න තුල මුල් බැසගත් ආතතියක යටි ප්‍රවාහයක් ස්ටයිනර් හා සසප අතර පැවතියේ ය.

වසර 2000 ජූනි මාසයේදී, වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයෙකු වූ ජෙෆ් ගෝල්ඩ්ස්ටයින් වයස 58 දී ලාස් වේගාස්හිදී අභාවප්‍රාප්ත විය. 1966 වසරේ වර්කර්ස් ලීගය පිහිටුවීමේදී, ඔහු ද එහි කොටස්කරුවෙකු විය. ජෙෆ් සෙබෙස්ටියන් නමැති අන්වර්ත ලේඛක නාමයෙන්, ආර්ථික කරුනු පිලිබඳව බුලටින් පත්‍රයට ඔහු අනේක විධ ලිපි ලිවීය. එසේම ඔහු, 1960 ගනන් අග හා 1970 ගනන් මුල් වසරවල, බටහිර වෙරලබඩ ප්‍රදේශයේ පක්ෂ කාර්යයන් සංවිධානය කිරීමේ ලා වැදගත් දායකත්වයක් සැපයීය. ස්ටයිනර් කල පරිද්දෙන්ම ගෝල්ඩ්ස්ටයින් ද, 1973 වසරේ වුල්ෆර්ත් අර්බුදය පැවති කාලය තුල වර්කර්ස් ලීගය අතහැර ගොස්, වුල්ෆර්ත්ගේ ඉල්ලා අස්වීමෙන් අනතුරුව යලි එක්විය. 1974 සරත් සමයේ සෙබෙස්ටියන් බුලටින් පත්‍රයේ කතුවරයා බවට පත් විය. එසේ වුවත්, 1977 මාර්තු මාසයේ ඔහු ව්‍යාපාරය අතහැර දමා ඉන් මඳ කලකට පසුව ලාස් වේගාස්හි පදිංචියට ගියේය. එහිදී ඔහු ගනිතය පිලිබඳ සිය කුසලතා, සූදුව ගැන ඔහුට සැමදා පැවති, එහෙත් පොදුවේ හිතකර නොවූ ලොල්කම සමඟ එකට මුසු කලේය. ඔහු තුරඟ තරඟ වලට ඔට්ටු අල්ලන්නෙකු බවට පත්විය. කුඩාවට වුවත්, ඉතා ලැදි අනුගාමිකයන් පිරිසක් දිනාගත් තුරඟ තරඟ සඟරාවක් ඔහු පලකලේය. ස්ටයිනර් වර්කර්ස් ලීගයෙන් ඉවත්වීමෙන් අනතුරුව, ඔහු හා ජෙෆ් ගෝල්ඩ්ස්ටයින් අතර මිතුදම යලි ගොඩනැගුනි.

ගෝල්ඩ්ස්ටයින්-සෙබෙස්ටියන්, සසප සමඟ අතිශයින් සීමිත වුව ද, පොදුවේ ගත් කල සුහද සබඳතාවක් පවත්වාගෙන ගියේය. කලින් අපගේ සහෝදරයෙක්ව සිටි ඔහුගේ මරනය ගැන සැබවින්ම අපි ශෝකයට පත් වීමු. සිය සමීප මිතුරාගේ අවමඟුලෙහිදී කථාවක් පැවැත්වීමට ස්ටයිනර් ලාස් වේගාස් බලා පිටත් විය. නොබෝ දිනකට පසුව සෙබෙස්ටියන්ගේ ජීවිතය සිහිපත් කිරීමට තමා විසින් ලියන ලද විස්තරයේ පිටපතක් ස්ටයිනර් මා වෙත එවීය.

සැබවින්ම, අවමංගල අවස්ථාවකදී පල කෙරෙන ප්‍රශස්තියකට, එයටම සීමාවූ ප්‍රමිතීන් ඇත. මේ ප්‍රමිතීන් වෛෂයිකත්වයේ නියාමයන් කෙරේ වඩාත් ක්ෂමාලාපී වන ප්‍රවේශයකට ඉඩ සලසයි. එසේ වුව ද ස්ටයිනර් එහි පලකරන අදහස් කියවන විට, ඔහු අදාල සීමාවන් ඉක්මවා ඇති බව මට පෙනී ගියේය. තුරඟ තරඟ සූදුකෙලින්නෙකු වශයෙන් ගෝල්ඩ්ස්ටයින්ගේ කාර්ය භාරය, හේගල් හා මාක්ස් මත පදනම්ව, භෞතිකවාදී අපෝහකය දක්ෂ ලෙස යොදාගැනීමක් සේ පෙන්වීමට ඔහු උත්සුක විය.

> මම දන්නා ආකාරයට ඔහුගේ පාඨකයන් බොහෝ දෙනෙකු ඒ සම්බන්ධව නොදැන සිටිය ද, තුරඟ තරඟවල ඔට්ටු ඇල්ලීම පිලිබඳ ජෙෆ්ගේ ප්‍රවේශය සැබවින්ම දාර්ශනික එකක් විය. ඔහු තමා පිලිබඳව මේ ආකාරයට හඳුන්වා ගැනීම සැක සහිත නමුත්, ජෙෆ් දර්ශනවාදයේ බැරෑරුම් ශිෂ්‍යයකු විය. අන් සියල්ලටමත් වඩා ජෙෆ් ප්‍රායෝගික විය. ඔහුට සැම විටම සත්‍යය සංයුක්ත දෙයක් විය. න්‍යාය ජීවමාන වන්නේ එය ප්‍රායෝගිකව යොදාගැනීම තුලිනි. අසරුවන්ගේ, පුහුනුකරුවන්ගේ හා ධාවන මංතීරු පිලිබඳ කරුනු ජෙෆ්ට විනෝදය ගෙනදුන්, සෞන්දර්යාත්මකව සතුට ගෙන දුන්, බුද්ධිමය වශයෙන් අභියෝගාත්මක දේ බවට පත් වූවා පමනක් නොව, ප්‍රගාඪ දාර්ශනික සත්‍යයන්

තුලට අන්තර් දෘෂ්ටියක් සපයන ඒවා ද විය. ඔහු බෙහෙවින් සතුටට පත්කලේ මෙම අන්තර් දෘෂ්ටීන් මඟින් බව මම දන්නෙමි.

ස්ටයිනර්ගේ කතාවේ සටහන මුලින්ම මට ලැබුනු විට, ඔහු වෙත යැවූ කෙටි ශෝක ප්‍රකාශය අවස්ථාවෝචිත යයි මම සිතුවෙමි. ස්ටයිනර්ගේ අදහස් සෘජු ලෙස විවේචනය කිරීමෙන් මම වැලකී සිටියෙමි. එහෙත් මම පහත සඳහන් නිරීක්ෂනය ඉදිරිපත් කලෙමි. "ස්වභාවධර්මයේ හා සමාජයේ සියලු ක්ෂේත්‍රයන් තුල, වෛෂයික සත්‍යය ඥානනය කිරීම සඳහා අපෝහක විධික්‍රමය බලගතු මෙවලමකි. එහෙත් තුරඟ තරඟ සඟරාවක් තුල පලකිරීමට වඩා එය ප්‍රයෝජනයට ගතහැකි වෙනත් මාර්ග තිබේ. සිය ජීවිතය වඩාත් පලදායී ලෙස ගතකිරීමේ විභවය ජෙෆ් සතුව පැවතුනේ" යයි දුක්මුසු හැඟුම් බරව මම සටහන් කලෙමි.

මේ සිත් පාරවන සිද්ධිය එතෙකින් අවසන් වනු ඇතැයි මම සිතුවෙමි. එහෙත් *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි* පලකිරීම සඳහා සෙබෙස්ටියන් පිලිබඳ විස්තීර්න ශෝකප්‍රකාශයක් ස්ටයිනර් විසින් ඉදිරිපත් කරනු ලැබූ අතර, එය පලකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිනි. මේ තීරනයෙන් ස්ටයිනර් අමනාපයට පත්ව ඇති බව, ඉන් පසුව මට නිව් යෝර්ක්හි සහෝදරවරුන්ගෙන් දැනගන්නට ලැබුනි. මම 2000 අගෝස්තු 13 දින ලිපියෙන් ඔහුගේ පැමිනිල්ලට පිලිතුරු දුනිමි.

හිතවත් ඇලෙක්ස්,

ජෙෆ් ගෝල්ඩ්ස්ටයින් සම්බන්ධයෙන් ඔබ ලිවූ ශෝකප්‍රකාශයට ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාදවීම ගැන කරුනාකර සමාවන්න. එම ප්‍රකාශය *ලෝසවෙඅ* පලකිරීම හෝ පල නොකිරීම පිලිබඳව හේතු දැක්වීමට අප අසමත් වීම ගැන ඔබ කනස්සල්ලට පත්ව ඇති බව මම දැනගතිමි. ඉන් දෙවැනි කාරනය අතපසුවීම ගැන මම සමාව අයැද සිටිමි. පැහැදිලි කිරීමක් අප විසින් ඉක්මනින්ම කල යුතු තිබුනි. එහෙත් ජෙෆ්ගේ අවමඟුලෙහිදී පලකල ඔබේ අදහස් පිලිබඳව මගේ කලින් ලිපියේ සඳහන් කල දේ සිහිගන්වන්නේ නම්, ඒ වන විටත් අපගේ පැරනි මිතුරා හා ආදි සොහොයුරාගේ ජීවිතය පිලිබඳ ඔබේ තක්සේරුව පිලිබඳ මගේ මතභේද ඒ තුල ඇඟවුම් කර තිබුනි.

ජෙෆ් ගැන දැනසිටි හා ඔහු සමඟ වැඩකල සියල්ලෝම, ඔහුගේ අකල් මරනය ගැන ශෝකයට පත්වූහ. අප අතුරින් එක් අයෙක්වත් භාවානුගතියෙන් මුලුමනින්ම තොර වූවන් නොවේ. එවන් ප්‍රවෘත්තියක් ලත් විගස, මේ භාවානුගතිය විසින්, මරනයට පත්වූ අයගේ යහපත්ම හා වඩාත්ම සිත් ඇදගන්නා සුලු ගති ලක්ෂන සිහිගන්වන්නට අපව පොලඹවයි. එහෙත් ඔබ විසින් ලියන ලද ශෝකප්‍රකාශය පල නොකිරීමට හේතු දක්වන ලෙස ඔබ ඉල්ලා සිටින බැවින්, ඒ ගැන මුලුමනින්ම අවංකව ලිවීමට මම බැඳී සිටිමි. ජෙෆ්ට ද අවශ්‍යව තිබුනේ එවැනි දෙයක් බව සිතීමට මම කැමැත්තෙමි.

ජෙෆ් පිලිබඳව අදාල නොවන දෙයක් ගැන වර්නනා කරන හැඳින්වීමකින් පලක් නැත. විප්ලවවාදී මාක්ස්වාදියෙකු වීමට ඔහු ප්‍රාර්ථනා කල නමුදු, බුද්ධිමය වශයෙන් ඔහු හැඩගැන්වුනු කාලය තුල ඔහු උකහාගත් සුලු ධනපති රැඩිකල් දේශපාලනයේ සමාජ පරිසරය හා දැක්ම අභිබවා යාමට ඔහු අසමත් විය. 1960 ගනන්වල මැද භාගයේ ට්‍රොට්ස්කිවාදය වැලඳගෙන ජාත්‍යන්තර කමිටුවට බැඳීම ඔහුගේ කීර්තිය සඳහා වන කරුනක් බව නිසැකය. වර්කර්ස් ලීගයේ ආරම්භක වර්ධනය කෙරෙහි ඔහු දායක විය. එසේ වුවත්, සිවිල් අයිතිවාසිකම් හා යුද විරෝධී ව්‍යාපාර බිඳී විසිරීයාමත් සමඟ, ඔහු අයත්වූ රැඩිකල්වාදීන්ගේ පරම්පරාවේ සැලකිය යුතු කොටසක් සමඟ ජෙෆ් ද, දේශපාලන අර්බුදයකට මුහුනපෑවේය. ස්ටැලින්වාදීන්ගේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හා පැබ්ලෝවාදීන්ගේ පාවාදීම්වලට පින්සිදුවන්නට, ධනේශ්වරය යලි ස්ථායීකරනය වීම, මාක්ස්වාදීන්ගෙන් අපේක්ෂා කලේ, දිගුකාලීන ඉදිරි දර්ශනයක් හා ඒ සඳහා සටන් වැදීමේ පුලුවන්කාර කමකි. මේ තත්ත්වය තුල ජෙෆ්ගේ හැකියාවන් වෙනුවට ඉදිරියට පැමිනියේ, ඔහුගේ බරපතල දුබලතා - විශේෂයෙන්ම සංශයවාදය හා නරුමත්වය කෙරේ පවා ඔහුට පැවති නැඹුරුව - යි.

ජෙෆ්, වුල්ෆර්ත් විසින් පක්ෂ සාමාජිකත්වය හැර යාමට බල කරනලද බොහෝ ජ්‍යෂ්ඨ සාමාජිකයන් අතරින් කෙනෙකු වී යයි ඔබ කරන ප්‍රකාශය සමඟ මම එකඟ නොවෙමි. සැබවින්ම, වුල්ෆර්ත්ගේ ගර්හිත හැසිරීම, වර්කර්ස් ලීගය තුල අර්බුදය උග්‍ර කල බව සත්‍යයකි. එහෙත් 1973-74 වසරවල සිද්ධීන් සියල්ලේ වරද වුල්ෆර්ත් මත පැටවීම වනාහි, ඔහුගේ දේශපාලන වැදගත්කම අතිශයෝක්තියට නැංවීමකි. ඇසිය යුත්තේ, ජෙෆ් ඇතුලු ජ්‍යෂ්ඨ නායකත්වයේ කිසිවෙකු වුල්ෆර්ත්ට එරෙහිව

කිසිදු අරගලයක් කිරීමට සූදානම් නොවූයේ මන්ද යන ප්‍රශ්නයයි. ආපසු හැරී බැලීමේදී, එම අවධිය තුල ව්‍යාපාරය හැරගිය අය ද පෙන්නුම් කලේ, එතරම් හානිකර අයුරකින් නොවූව ද, වර්කර්ස් ලීගයේ ජාතික ලේකම් (වශයෙන් වුල්ෆර්ත්) මුහුන දුන් දේශපාලන අර්බුදයටම බව ය.

වුල්ෆර්ත් ඉවත්කිරීමෙන් පසුව, 1973-74 වසරවල ව්‍යාපාරය හැරගිය ලූසී සෙන්ට් ජෝන් ද ඇතුලු තවත් ගනනාවක් මෙන්ම ජෙෆ් ද, වර්කර්ස් ලීගයට යලි එක්විය. එහෙත් මේ සියල්ලෝම පාහේ, අවසානයේදී ජෙෆ් පවා, වසර තුනක් ඇතුලත යලි පක්ෂයෙන් ඉවත්ව ගියහ. වර්කර්ස් ලීගයෙන් ඉවත්ව යාමට, ඒ හෝ මේ පුද්ගලයාට බලපෑ නිශ්චිත හේතු කුමන අන්දමේ ඒවා වුව ද, ජෙෆ්ගේ ඉල්ලා අස්වීම, එක්සත් ජනපදය තුල වඩාත් පුලුල් දේශපාලන ප්‍රපංචයක කොටසක් විය. එනම්, 1960 ගනන් වල හා 1970 ගනන් මුල් භාගයේ මහජන විරෝධතා ව්‍යාපාරය බෙලසුන්ව කඩාවැටීමයි.

ජෙෆ්ගේ ජීවිතයේ ඉතිරි වසර 23 දිස්වනු ඇත්තේ කාලයේ හා සහජ කුසලතාවේ දැවැන්ත බාදනයක් ලෙසය. 1980 ගනන් වල මැද භාගයේදී ලාස් වේගාස් හි පදිංචියට ගිය ජෙෆ් පිලිබඳව ඔබ විසින් ලියන ලද ශෝක ප්‍රකාශය කියවන විට අපහසුතාවෙන් ඇඟ කිලිපොලා යාම මට වලක්වාගත නොහැකි විය. "ලාස් වේගාස්හි දී තුරඟ තරග ලෝලියෙකු වීමේ සිය සිහිනය සැබෑ කර ගැනීමට ඔහුට හැකි වී" යයි කියා තිබීම නිසා එසේ සිදු විය. "ඔහු වැනි දේශපාලන ඉතිහාසයකට හිමිකම් කියන අයෙකු මෙවැනි වෘත්තියක යෙදීම සත්තකින්ම අනපේක්ෂිත සිදුවීමකි.... " එම කියමන මම ද අනුමත කරමි.

මෙය තුරඟ තරග හා සූදුවට ඇබ්බැහිවීම පිලිබඳව ජෙෆ්ට අවලාද නැගීම පිලිබඳ කාරනයක් නොවේ. එහෙත් වෘත්තීය තේරීමක් ලෙස තුරඟ තරග වලට ලොල්වීම පිලිබඳව යමෙකුගේ තක්සේරුව සැලකිල්ලට නොගෙනම, ජෙෆ්ගේ දේශපාලන ඉතිහාසයෙහි සන්දර්භය තුල එය නිරූපනය කලේ, ඉමහත් පිරිහීමකි. ඔබගේ ශෝක ප්‍රකාශය මුලදීම මාක්ස්වාදී අර්ථශාස්ත්‍රය පිලිබඳව ජෙෆ්ගේ "ප්‍රවීනත්වය" ගැන සඳහන් කරයි. එනමුදු ඔහු "සූදුවේ චමත්කාරයට" ආකර්ශනය වීම පිලිබඳව ලිවීමේදී ඔබ, "ධනේශ්වර පද්ධතිය විසින් ජනනය කරන ලද මුලාවෙන් ජෙෆ් මිදී නොතිබුනි" යයි පාඨකයාට දන්වා සිටියි. "අන් සියල්ලටම වඩා, කෙනෙකුගේ සහජ කුසලතාවන් උපයෝගී කර ගනිමින් එම පද්ධතිය ජයගත හැකිවනු ඇතැයි යන මුලාවෙන් ඔහු මිදී තිබුනේ නැතැයි" ඔබ දැනුම් දෙයි. වෙනත් වචනවලින් කිවහොත්, ලාස් වේගාස්හි ජෙෆ්ගේ ජීවිතය හා ඔහු තුල කලින් පැවති විප්ලවකාරී දෘෂ්ටිය බාදනය වීම අතර සම්බන්ධයක් නොතිබුනා නොවේ.

වර්කර්ස් ලීගයේ ආරම්භක සාමාජිකයෙකුගේ අභාවය පිලිබඳව සටහනක් තැබීම *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* යෝග්‍ය නොවන්නක් නොවේ. එසේ කිරීමට සත්තකින්ම අපි කැමැත්තෙන් සිටින්නෙමු. එහෙත් ජෙෆ් පිලිබඳ අපගේ පුද්ගලික හැඟීම් කුමක් වුවත් දේශපාලන වෘත්තීය ජයග්‍රහන, අතිශයෝක්තියට නැංවීම හෝ ඔහුගේ පසුකාලීන දේශපාලන පරිහානියේ ගැඹුර ලුහු කොට දැක්වීම වැරද්දක් වනු ඇත. වර්කර්ස් ලීගයේ ආරම්භක ඉතිහාසයෙහි දී - හා ඇතැම් අංශයන් සම්බන්ධයෙන්, ප්‍රාග් ඉතිහාසයේදී - ජෙෆ් රඟපෑවේ ද්විතීයික භූමිකාවකි. ඔහුගේ වැඩිහිටි ජීවිතයේ වැඩි පංගුවක් අයත් වන්නේ ඔහු පක්ෂයෙන් ඉවත්ව ගත කල වසරවලට ය.

ඔබ කර්කශ යයි සැලකිය හැකි භාෂාවෙන් ඔබ ඇමතීමට සිදුවීම ගැන මම කනගාටු වන්නෙමි. කලින් අප සහෘදයෙකුව සිටි මොහු කෙරේ අනෙකුත් අය හා මා තුල ඇති ලබැඳියාව, අප ව්‍යාපාරයේ ඉතිහාසය ගැන වෛෂයික තක්සේරුවක් කිරීමේ වගකීමෙන් අප මුදා ලන්නේ නැත.

උනුසුම් සුභපැතුම් සමඟ

ඩේවිඩ්

ස්ටයිනර් මේ ලිපියට පිලිතුරු දුන්නේ නැත. එහෙත් ජෙෆ් ගෝල්ඩ්ස්ටයින් ගැන මවිසින් ලියන ලද බෙහොමයක් දේ තමා සම්බන්ධයෙන් ද තක්සේරුවක් විය හැකි යයි ඔහු අවබෝධ කරගැනීම පිලිබඳව මට සැකයක් නැත.

**මතු සම්බන්ධයි**

**සටහන්:**

**(24)** න්‍යායික ප්‍රශ්න පිලිබඳව 1997 ස්ටයිනර්ගේ ලිපිය ඉදිරිපත් කරන තක්සේරුව, ස්ටයිනර්/බ්‍රෙනර් ලියවිලි තුල දැන් විවාද කරන ආස්ථානයන්ට සපුරාම

වෙනස්ය. ඉහතින් සඳහන්කල ලිපියෙහි ස්ටයිනර් "විශේෂයෙන්ම කාලෝචිත" යයි මගේ දේශනය අගයන්නේ, එය පශ්චාත්නූතනවාදයේ පැතිර පවත්නා හා බලවත් ආස්ථානයන්ට අභියෝග කරන බැවිනි. එසේ වුව ද, 2006 දී *වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද* යන ස්ටයිනර්/බ්‍රෙනර් රචනය තුල ඉදිරිපත් කරන්නේ මුලුමනින්ම වෙනස් තක්සේරුවකි. එහිදී පශ්චාත්නූතනවාදය මාක්ස්වාදීන්ගේ අවධානයටවත් ලක් නොවිය යුතු වැදගැම්මකට නැති, දැනටමත් භායනයට පත්වෙමින් තිබෙන විලාසිතාවක් ලෙස බැහැර කෙරේ. "20 වසරකට පෙරාතුව" ස්ටයිනර්/බ්‍රෙනර් තදින්ම කියා සිටියේ පශ්චාත් නූතනවාදයට ප්‍රහාරයක් එල්ල කිරීම අත්‍යවශ්‍ය බවය. අද නම් එය, අස්ප කුනකට තැලීම වැනි නිරර්ථක උත්සාහයක් නොවන්නේ නම් අවම වශයෙන් කුරුම්ට් වැයමකි." (*මාක්ස්වාදය, ඉතිහාසය හා සමාජවාදී විඥානය* 20 පිටුව.)

1997 ලිපිය පිලිබඳව විශේෂයෙන් සැලකිය යුතු තවත් කාරනයක් නම්, රිචඩ් රෝර්ටි ගැන සඳහන් කරමින්, තත්කාර්යවාදය හා පශ්චාත් නූතනවාදය අතර සම්බන්ධය පිලිබඳව ස්ටයිනර් දැක්වූ අදහසයි. එසේ වුවත්, ආත්මීය විඥානවාදයේ හා අහේතුකවාදී දර්ශනවාදයේ මෙම ද්විත්ව ආකෘතීන් අතර සම්බන්ධය කෙරෙහි මා යොදන අවධාරනය, ස්ටයිනර්/බ්‍රෙනර්ගේ *වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද* හා මෑත ලිපිය වන *හිස හෝ හදවතින් තොර මාක්ස්වාදය (එම්ඩබ්ලිව්එච්එච්)* තුල හෙලා දැක තිබේ.

ස්ටයිනර්/බ්‍රෙනර් මෙසේ ලියති.

"සමකාලීන තත්කාර්යවාදී දර්ශනවාදය තුල පශ්චාත් නූතනවාදය ප්‍රධාන ප්‍රවාහයක් බව නෝර්ත් කියා සිටින විට ඉන් අදහස් වන්නේ *ඔහු තත්කාර්යවාදය ඉවත දමා ඇති බැවින් අප තව දුරටත් ඒ ගැන උත්සුක නොවිය යුතුය* යන්නයි (එම, පිටු 88, අවධාරනය මුල් ලිපියේ) ස්ටයිනර් විසින්ම තත්කාර්යවාදය හා පශ්චාත් නූතනවාදය අතර පුරුක පිලිබඳව කල අවධාරනය ප්‍රතික්ෂේප කිරීම සඳහා මා ලිවූ දේ මෙහිදී ස්ටයිනර්/බ්‍රෙනර් විසින් විකෘති කර දක්වයි. *මාක්ස්වාදය, ඉතිහාසය හා සමාජවාදී විඥානය* තුල මා සැබවින්ම ලිව්වේ මෙයයි.

"...සියල්ලට ප්‍රථමයෙන්, මා කොතැනක හෝ ප්‍රකාශකරවත්, අඩු ගනනේ අඟවාවත් නැති දෙයක් නම් පශ්චාත් නූතනවාදය විසින් තත්කාර්යවාදය විස්ථාපනය කරනු ලැබ ඇතැයි යන්න ය. නැත; එය වනාහි, තත්කාර්යවාදී චින්තනයේ එක්තරා ප්‍රවර්ගයකි. සත්තකින්ම එය වනාහි සම්භාව්‍ය තත්කාර්යවාදී චින්තනය තුල විලියම් ජේම්ස්ගේ සමයේ පටන් පැවත එන ආත්මීය විඥානවාදී, ස්වේච්චානුගත පමනක් නොව අහේතුකවාදී අංගයන් පවා බාරගෙන ඒවා, ආන්තික හා ප්‍රතිගාමී සමාප්තියට ගෙන යන තත්කාර්යවාදී චින්තනයේ අති මූලිකවම විශේෂිත වර්ගයක් යයි යෝජනා කිරීම ම තත්කාර්යවාදයට පිරිනැමෙන මුඛ්‍ය සහනයක්ය යන්නයි. ඒ වනාහි තම පශ්චාත් නූතනවාදී ගුරු පරපුරේ ජරා'න්ත ක්‍රියා හේතුකොටගෙන තත්කාර්යවාදයට විඳීමට සිදුව ඇති බුද්ධිමය විලිලැජ්ජාවෙන් තත්කාර්යවාදය ආරක්ෂාකර දීම සඳහා දෙනු ලබන සහනයකි. (එම, පිටු . 20-21)

**(25)** බුද්ධි ප්‍රබෝධය ගැන මා කල දේශනය පිලිබඳ ස්ටයිනර්ගේ එකඟත්වය, බුද්ධි ප්‍රබෝධය ආරක්ෂා කිරීම පිලිබඳව ස්ටයිනර්/බ්‍රෙනර් මා හෙලා දකිමින් මෑතකදී පලකල ඔවුන්ගේ ලියවිල්ල සමඟ මුලුමනින්ම විසංවාදීය.

**(26)** ස්ටයිනර්ගේ පසුකාලීන පරිනාමයේ සන්දර්භය තුල, *Alienation and Revolution* (පරත්වාරෝපනය හා විප්ලවය) පිලිබඳව වඩාත් මෑතකදී කල සමාලෝචනයේදී ඔහුගේ වත්මන් සංකල්පයන්ගේ කලලරූපී ප්‍රකාශනය මෙම රචනය තුල දක්නට ලැබෙන බව පැහැදිලි විය. ස්ටයිනර්ගේ රචනයෙහි න්‍යායික ආකෘතිය *"මිනිසාගේ නෛසර්ගික ස්වභාවය"* පිලිබඳ මාකියුස්ගේ අත්‍යවශ්‍ය හා ඓතිහාසික සංකල්පයෙන් ගොඩනගා තිබේ ස්ටයිනර් අවිවේචනාත්මකව ම එයට අනුගත වෙයි. එබැවින් ස්ටයිනර්ගේ ලියවිල්ල තුල අපට, "මිනිසාගේ නෛසර්ගික ස්වභාවය නිර්නය කරන්නේ මිනිසාගේ ආසක්තයන් හා ඔහුගේ ධාරිතාවය අතර අන්තර් ක්‍රියාකාරිත්වය මගින්" බවට කෙරෙන ප්‍රකාශය හමුවේ. පසුව ඔහු අවධාරනය කරන්නේ "මිනිසාගේ නෛසර්ගික ස්වභාවය පිලිබඳ මාක්ස්ගේ සංකල්පය, ප්‍රකාශකයන් කිහිපදෙනෙකුට හැර අන් සියල්ලන්ට ඇදහිය නොහැකි කලු පෙට්ටියක් බවට අවසනාවන්ත ලෙස පත්ව තිබෙන" බවය. මේ සන්දර්භය තුල ස්ටයිනර්, හෝර්කයිමර්, තියඩෝර් ඇඩෝනෝගේ කටයුතු සුවිශේෂිතව සඳහන් කරයි. "මාකියුස් වඩාත් වැදගත්ය." ස්ටයිනර්, මාකියුස් වැන්නවුන් ඉදිරිපත් කිරීමේදී, 1844 මාක්ස්ගේ අත් පිටපත් ඒවායේ ඓතිහාසික හා බුද්ධිමය සන්දර්භයෙන් උගුලුවා දමයි. ස්ටයිනර්ගේ රචනාව, *"මිනිසාගේ නෛසර්ගික ස්වභාවය"* විකසිත වන හේතුධර්මතාවාදී විවරනයක් ලෙස මාක්ස්වාදය අර්ථකථනය කරන තරම් දුරකට ගමන් කරයි. මෙය, හේතුධර්මය එක පැහැර ප්‍රතික්ෂේප කරන මාක්ස්වාදයට කිසිදු සම්බන්ධයක් නොදක්වන තර්කයකි. මාක්ස්, හෙගලියානු විඥානවාදය හා ෆොයබාක්ගේ මානව විද්‍යාවාදය පිලිබඳ සිය විවේචනය ගැඹුරු කරමින් සිටින අතර තුර, නිෂ්පාදනයේදී මිනිසාගේ සමාජ සම්බන්ධතාවන්ගේ

ඓතිහාසික සංවර්ධනයට පිටින් හා ඊට ඉහලින් පවත්නා "මානවයාගේ සාරය" හෝ "නෛසර්ගික ස්වභාවය" පිලිබඳව කථා කිරීම නතරකොට තිබුනි. එසේ වුවත්, 1845 දී ලියන ලද ඔහුගේ *ෆොයබාක් පිලිබඳ ප්‍රවාද* තුල මාක්ස්, "මානවයාගේ සාරය වනාහි සෑම තනි පුද්ගලයෙකුම තුල ආවේනිකව පවත්නා වියුක්තයක් නොවන බව" කියා සිටියේය. "එහි යථාර්ථය තුලදී, එය වනාහි සමාජ සම්බන්ධතාවන්ගේ සමස්තයයි" (මොස්කව් ප්‍රොග්‍රස් පබ්ලිෂර්ස්, 1973, 64 වන පිටුව) ඉතිහාසය පිලිබඳව අලුතින්ම විස්තාරනය කරන ලද සංකල්පයේ පදනම මත, පසුකාලීන රචනාවන්හි මාක්ස් හා එංගල්ස්, නිෂ්පාදනයේ නිශ්චිත සමාජ සම්බන්ධතාවන් මගින් බුද්ධිමය වශයෙන් ද භාවිතයෙන් ද හැඩ ගස්වනු ලැබූ සැබවින්ම ජීවත් වන ඓතිහාසිකව සුවිශේෂී වූ මිනිසා, දර්ශනවාදී ලෙස පිලිසිඳගත් වියුක්ත මිනිසා තුලට දියකර හැරීමේ උත්සාහයන් කර්කෂ විවේචනයට ලක් කලේය. මේ අර්ථයෙන්, මැක්ස් ස්ටර්නර් (සේන්ට් සැන්චෝ) පිලිබඳ ඔවුන්ගේ විවේචන විශේෂයෙන්ම අදාල වන්නේය.

ස්ටර්නර්, කුමන අරමුනක් හෝ සම්බන්ධතාවක්, කොයියම්ම ආකාරයකින් හෝ මමත්වයට පරිබාහිර, මමත්වයේ පරත්වාරෝපනය ලෙස ඉදිරිපත් කරයි. අනෙක් අතට, ඉදිරියේදී අපට දැකගතහැකි පරිදි, සේන්ට් සැන්චෝට ද, කුමන අරමුනක් හෝ සම්බන්ධතාවක් මමත්වය විසින් නිර්මානය කල කිසිවක් හා එයට අයත් වන දෙයක් ලෙස ඉදිරිපත් කල හැකිය. ඊට අමතරව, පලමුකොටම කුමන සම්බන්ධතාවක් හෝ පරත්වාරෝපනයේ සම්බන්ධතාවක් ලෙස, ඔහු ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් නොකරන හිතුවක්කාරී ක්‍රමය (සෑම දෙයක්ම ඉහත සමීකරනයන්ට ගැලපෙන පරිදි දැක්වීම සඳහා) තිබියදී, ඔහුගේ එකම උත්සුකය වන්නේ, සියලු තත්‍ය සම්බන්ධතා හා තත්‍ය පුද්ගලයන්ද (පරත්වාරෝපනය වූවන් ලෙස) (දැනට මේ දාර්ශනික ප්‍රකාශනය රඳවා ගැනීමට නම්) පරත්වාරෝපනය නම් මුලුමනින්ම (වියුක්ත) වැකිකඩට (පරිවර්තනය කිරීම) සඳහා ඉදිරිපත් කිරීම බව අපට දැනටමත් මෙහිදී දැකගත හැකිය. (*The German Ideology* ජර්මන් අයිඩියලොජි, එකතු කල කෘති, 5 වන වෙලුම, (නිව් යෝර්ක්, ජාත්‍යන්තර ප්‍රකාශකයෝ, 1976) 281 වන පිටුව, වරහන් මුල් පෙලෙහි)

මාක්ස්ගේ ඓතිහාසික භෞතිකවාදී විවේචනය හා පරත්වාරෝපනය පිලිබඳ සංකල්පයේ අලුත් සංස්කරනය, වඩාත් පොහොසත් ලෙස වර්ධනය කරන ලද්දේ 1857-58 වසරවල ලියන ලද සිය *ග්‍රෑන්ඩ්‍රිස්* නමැති කෘතිය තුලය. මිනිසාගේ පුද්ගලිකත්වය හා ඔහුගේ පරත්වාරෝපනය, ඓතිහාසිකව නිගමනය කරන ලද සමාජ ක්‍රියාවලියක කොටසක් යයි එහිදී ඔහු අවධාරනය කරයි. මාක්ස් පැහැදිලි කරන අන්දමට, තමන්ගේම ප්‍රජා (gemeinschaftlich) සම්බන්ධතා ලෙස ද, ඒ නිසා, තමන්ගේ ප්‍රජාවගේ පාලනයට යටත් වූද, සාර්වත්‍රික ලෙස වර්ධනය වූ පුද්ගලයාගේ සමාජ සම්බන්ධතා වනාහි, ස්වභාව ධර්මයේ නිර්මානයක් නොව, ඉතිහාසයේ නිමැවුමකි. මෙම පුද්ගලිකත්වය සම්භාව්‍යතාවක් බවට පත්වන විට, ධනය වැඩී යන ප්‍රමානය හා සාර්වත්‍රික බව, පූර්ව කොන්දේසියක් ලෙස හුවමාරු වටිනාකම්වල පදනම මත නිෂ්පාදනය අරමුනු කර ගනියි. ඒවායේ සාර්වත්‍රික බව නිර්මානය කරන්නේ, පුද්ගලයා තමාගෙන්ම හා අන් අයගෙන්ද පරත්වාරෝපනය වීම පමනක් නොව, ඔහුගේ සම්බන්ධතාවන්ගේ හා හැකියාවන්ගේ සාර්වත්‍රික බව හා පරිපූර්නත්වයද ය. [*ග්‍රෑන්ඩ්‍රිස්, Introduction to the Critique of Political Economy,* (දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳ විවේචනයට හැඳින්වීමක්,) පරිවර්තනය මාටින් නිකොලස් (මිඩ්ල්සෙක්ස්, එංගලන්තය, 1973) 162 පිටුව].

*පරත්වාරෝපනය හා විප්ලවය*, ස්ටයිනර්/බ්‍රෙනර් වෙබ් අඩවියෙහි පලකොට ඇත. එහි දිනය 1997 මැයි ලෙස සඳහන් වුවද, වෙබ් අඩවියෙහි ඉදිරිපත්කර ඇති සංස්කරනය, 1999 වසරේ මුල් භාගයේ සම්පූර්න කරන ලද, සැලකිය යුතු තරම් දුරකට යලි කෙටුම්පත් කරන ලද ලියවිල්ල ය.

**(27)** ප්ලේටෝගේ ලියවිලි තුලින් භෞතිකවාදය කෙරේ විඥානවාදයේ විරෝධය ප්‍රකාශිත විය. ස්වභාවධර්මය පිලිබඳ භෞතිකවාදී අවබෝධයක් සඳහා පදනම් දමනු ලැබුනේ ඩෙමොක්‍රිටස්ගේ පරමානුකවාදී න්‍යාය තුලින්ය. එමනිසා ඩයෝජිනීස් ලැයර්ටියස්ට අනුව, ඩෙමොක්‍රිටස්ගේ සියලු ලියකියවිලි පුලුස්සා දැමීමේ අභිලාෂයක් ප්ලේටෝ පල කලේය.

**(28) http wsws.org 1999**

**(29)** ජාත්‍යන්තර කමිටුව සමඟ ස්ටයිනර්ගේ දේශපාලන සම්බන්ධකම්වල පැහැදිලි වෙනස්වීම හා සසපය සමඟ ඔහුගේ පැරනි සබඳතා පිලිබඳව කරුනු වැරදි ලෙස පෙන්වීම හේතුකොටගෙන, මෙම ලිපි හුවමාරුව හා අනෙකුත් ලිපි ගනුදෙනු ප්‍රසිද්ධියට පත්කිරීම අවශ්‍ය විය.

**(30)** මේ ප්‍රශ්නයේ කේන්ද්‍රීය භාවය හා එහි දාර්ශනික ගම්‍යයන් පිලිබඳව මුලින්ම සවිස්තරාත්මකව පැහැදිලි කරන ලද්දේ, සුවිශාල බලපෑමක් ඇතිකල සිය කෘතිය වන *ලුඩ්විග් ෆොයබාක් හා සම්භාව්‍ය ජර්මානු දර්ශනවාදයේ අවසානය* තුලින් ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින්ය. ඔහු මෙසේ ලිවීය.

සමස්ත දර්ශනවාදයේත් වෙසෙසින්ම වඩාත් මෑත දර්ශනවාදයේත් අතිශය මූලික ප්‍රශ්නය නම් චින්තනය හා පැවැත්ම අතර සම්බන්ධය කවරේද යන්නයි.

...අහම්බෙන් මෙන් මධ්‍යතන යුගයේ ගුරුකුලවාදයෙහි ද මහත්සේ බලපවත්වා තිබුනු පැවැත්මට සම්බන්ධව චින්තනය කවර තැනක් ගන්නේ ද යන ප්‍රශ්නය එනම්, මනස ප්‍රාථමික ද නැතහොත් ස්වභාව ධර්මය ප්‍රාථමික ද යන මේ ප්‍රශ්නය පල්ලියට මුහුන දුන් කල්හි පහත දැක්වෙන තීව්‍ර ස්වභාවය ගත්තේය. දෙවියන් වහන්සේ ලෝකය නිර්මානය කල සේක් ද? එසේ නැතහොත් ලෝකය සදාකාලිකව පැවත එන්නේ ද?

මෙම ප්‍රශ්නයට දුන් පිලිතුර අනුව දර්ශනවාදීහු විසල් කඳවුරු දෙකකට බෙදී ගියහ. ස්වභාව ධර්මයට වඩා මනස ප්‍රාථමික යයි ප්‍රකාශ කලාවූ ද එසේ ප්‍රකාශ කිරීම නිසාම අවසාන විග්‍රහයේදී කිසියම් ආකාරයකින් ලෝක නිර්මානය සිදුවූවා යයි පිලිගත්තාවූ ද පුද්ගලයන්ගෙන් විඥානවාදී කඳවුර ගොඩ නැගින. ස්වභාව ධර්මය ප්‍රාථමික යයි සැලකූ අන්‍යයෝ භෞතිකවාදයේ විවිධ ගුරුකුලයන්ට අයත් වූහ. (කම්කරු මාවත ප්‍රකාශන, 15-17 පිටු)

**(31)** [*Marxism, Pragmatism and Revisionism* (මාක්ස්වාදය, තත්කාර්යවාදය හා සංශෝධනවාදය) *හතරවන ජාත්‍යන්තරය* 1975 පිටුව 109.]

**(32)** [*Trotskyism Versus Revisionism සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය* 7 වන වෙලුම *The Fourth International and the Renegade Wohlforth ද ෆෝර්ත් ඉන්ටර්නැෂනල් ඇන්ඩ් ද රෙනිගේඩ් වුල්ෆර්ත්* නිව් යෝර්ක් ලේබර් පබ්ලිකේෂන් 1984 පිටුව 93.]

**(33)** *මාක්ස්වාදයේ බැනරය යටතේ* යන සෝවියට් න්‍යායික සඟරාවක ප්‍රථම කලාපය හඳුන්වා දෙමින් කල රචනාවෙහි ට්‍රොට්ස්කි ලිවූ පරිදි, "සිය ඓතිහාසික මූලයන්ගෙන් ද සිය සමකාලීන ආර්ථිකයෙන් ද මානව සමාජයම ස්වභාව ධර්මයේ ලෝකයෙහි ඉතිහාසය තුලට පැතිර යයි. ද්‍රව්‍යයේ භෞතික හා රසායනික ගුනයන් ක්‍රියාශීලී වන ස්වභාව ධර්මයේ රසායනාගාරය තුලින් පිලිවෙලින් සම්භවය ලත් කුඩා ඓන්ද්‍රීය සෛලයෙන් ආරම්භවූ සමස්ත වර්ධනයේ එක් පුරුකක් ලෙස අප සමකාලීන මිනිසා දැකිය යුතුය." [*Problems of Everyday Life,* (ප්‍රොබ්ලම්ස් ඔෆ් එව්රිඩේ ලයිෆ්), නිව් යෝර්ක්, මොනාඩ් ප්‍රෙස්, 1979, 272 පිටුව]

**(34)** 1999 ජූනි වලදී කරන ලද මෙම තක්සේරුව, අප විසින් දැනටමත් උපුටා දක්වන ලද "1993-1999 අතර වසරවල සිදුවූයේ ධනේශ්වර සමාජයේ දැවැන්ත පන්ති පීඩනයන් ඉදිරියේ ජාත්‍යන්තර කමිටු නායකයන් ඇද වැටීමය" යන ස්ටයිනර්/බ්‍රෙනර් ගේ වර්තමාන ප්‍රකාශය සමඟ අපි සසඳ බලමු. 1999 වසරේදී ලෝක සමාජවාදී වෙබ් අඩවිය හා එහි විප්ලවකාරී විභවය පිලිබඳ ඉතා ශුභදායක තක්සේරුව හා වඩාත් මෑතක පලවූ ස්ටයිනර්/බ්‍රෙනර්ගේ ලියවිලි වල ලෝසවෙඅ පිලිකුල් සහගත ලෙස බැහැර කිරීම අතර ගිනියම්වූ ප්‍රභේදය ද පාඨකයා නිරීක්ෂනය කරනු ඇත.

**(35)** හරියට මේ ආකාරයටම, ජේම්ස් බර්න්හැම් මාක්ස්වාදය අපකීර්තියට පත්කිරීමට උත්සුකවූ බව යලි සිහිපත් කල යුතුය. අපෝහක භෞතිකවාදය සම්බන්ධ කරුනු මත ට්‍රොට්ස්කි සමඟ විවාදයකට පැටලීම පිලිබඳව තමන්ගේ අකැමැත්ත සාධාරනීකරනය කරමින් ඔහු ප්‍රකාශ කර සිටියේ, "ආගම පිලිබඳව වාද කිරීම මම බොහෝ කලකට පෙර නවතා දැමුවෙමි." යනුවෙනි. එයට ට්‍රොට්ස්කිගේ පිලිතුර වූයේ "මට වැටහී ගිය අන්දමට ඔබේ වචන වලින් ගම්‍ය වන්නේ, මාක්ස්, එංගල්ස් හා ලෙනින්ගේ අපෝහකය, ආගමික ක්ෂේත්‍රයට අයත් වන බවකි." යන්නය. (*මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා*, කම්කරු මාවත ප්‍රකාශන,)

**(36)** දාර්ශනික නිකායවාදය පිලිබඳ නොවැක් ගේ හෙලාදැකීමට වඩාත් සවිස්තර පිලිතුර පලවූයේ, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් 1973 වසරේ නිකුත් කරන ලද ප්‍රකාශයක් තුලින් ය.

එනමුදු දර්ශනවාදය තුල නිකායවාදය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? මේ ක්ෂේත්‍රය තුල මාක්ස්වාදය නිසැක ලෙසම සම්මුති වලට එලඹෙන්නේ නැත. දර්ශනවාදී ක්ෂේත්‍රය තුල සෑම මතභේදයක්ම විශ්ලේෂනය කොට පොරබැදිය යුතුය. ව්‍යාපාරයේ මූලික පදනම් අදාල වන්නේ මෙහිදීය.

උපායමාර්ගික නම්‍යශීලීත්වයට ඉඩක් ඇත්තේ අපෝහක භෞතිකවාදයේ ස්ථිර පදනම මත පමනි. මූලෝපායේ අවධිගත සීරුමාරු කිරීම් සිදුකර ගත හැක්කේ ඒ පදනම මත පමනි. දර්ශනවාදය තුල *උපායමාර්ග* පිලිබඳ ප්‍රශ්නයක් පැන නොනගියි. ලෝකය වෙනස් කිරීමේ අරගලය තුල හා, ඒ හරහා, න්‍යාය භාවිතය සමඟ ඒකාබද්ධ වන්නේය යන අපෝහක භෞතිකවාදී ස්ථාවරය, මාක්ස්ට පෙර පැවති සියලු දර්ශනවාදයන්ගේ කූඨප්‍රාප්තිය වන අතරම, පැරැන්නෙන් කැඩී වෙන්වීමක් ද වේ. (හෙගලියානු අර්ථයෙන් එය නිශේධනයකි.) හේගල්ගේ සිට සියලු දර්ශනවාදයන්, එක්කෝ, මාක්ස්වාදයේ වර්ධනය වන

න්‍යායේ කොටසකි. නැතහොත්, අපෝහක භෞතිකවාදයට එරෙහි අරගලය තුල ගොඩනගන ලද ධනේශ්වර ක්ෂමාලාපයන් ය.

මෙතැනදී "නිකායවාදය" පිලිබඳ ප්‍රශ්නය මතුකල හැක්කේ අපෝහක භෞතිකවාදය හා ධනේශ්වර දර්ශනවාදය අතර මායිම් රේඛා බොඳ කිරීමට අදහස් කරන අයට පමනි. [*Trotskyism Versus Revisionism,* (*සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය,*) 6 වන වෙලුම, ලංඩන් නිව්පාක්, 1975, 191 පිටුව]

**(37)** *මාක්ස්වාදය ද වෛෂයිකවාදය ද* හා එම්ඩබ්ලිව්එච්එච් යන දෙකෙහිදීම සසපයේ සාමාජිකත්වය සඳහා සිය ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කල වර්ෂය 1998 ලෙස ස්ටයිනර් සාවද්‍ය ලෙස ඉදිරිපත් කරයි. ස්ටයිනර්/බ්‍රෙනර් සිය වෙබ් අඩවියෙහි 2008 අප්‍රේල් 5 දින පලකල එම්ඩබ්ලිව්එච්එච් අතිරේකයකින් මේ වරද යලිත් සිදුකර ඇත. සසප හා මා සමඟ කරන ලද ලිපි හුවමාරුවෙහි පිටපත් ඔහු සතුව ඇතැයි යමෙකු උපකල්පනය කල යුතු හෙයින් ස්ටයිනර් මේ දිනය යලි යලිත් වසරකින් වරදවා ප්‍රකාශ කලේ මන්දැයි පූර්න වශයෙන් පැහැදිලි නොවේ. එසේ වුව ද සිය ඉල්ලුම් පත ඉදිරිපත් කරන ලද්දේ දාර්ශනික ප්‍රශ්න මත කුමන හෝ මතභේද ඉස්මතු වීමට පෙරාතුව බව ස්ටයිනර් යලි යලිත් ස්ථිරව ප්‍රකාශ කර සිටින බව - එහි මෑතම අවස්ථාව 2008 අප්‍රේල් අතිරේකයයි. - සටහන් කල යුතුය. එසේ වුවත් වාර්තාවෙන් පෙන්නුම් කෙරෙන්නේ 1999 ජූනි 25 දිනැති සිය ලිපියේ මූලික මතභේද අනාවරනය වීමෙන් පසුව ස්ටයිනර් සාමාජිකත්වය සඳහා සිය ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කල බවය. සිය වර්තමාන දේශපාලන වෘත්තාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා සිය ඉල්ලුම් පත්‍රය ඉදිරිපත්කල දිනය ස්ටයිනර් විසින් වෙනස්කල බවට යමෙක් නිගමනය කල යුතුය.

**(38)** බ්ලැක් පැන්තර්ස් "ඇමරිකාව" ෆැසිස්ට් රාජ්‍යයක් ලෙස හැඳින්වූ වග සත්‍යයකි. එහෙත් මේ අවමංගත "න්‍යායට" බුද්ධිමය විශ්වාසනීයත්වයක් ගෙන දීමේදී ඊටත් වඩා මෙහෙයක් ඉටු කලේ හර්බට් මාකියුස්ගේ ලියවිලි හා දේශනය. ස්ටයිනර් ශිෂ්‍යයෙකු සිටියදී නව විද්‍යායතනයෙහිදී කරන ලද දේශනයක් තුල මාකියුස් ප්‍රකාශකර සිටියේ "පොදු වශයෙන් ඇමරිකානු ජනතාව අතර දේශපාලන හා මනෝවිද්‍යාත්මක අග්නි ජාලාවක් වැනි තත්ත්වයක්, මූල-ෆැසිස්ට්වාදී ගති ලක්ෂනයක්, පෙන්නුම් කරන බවයි. [*Counter-Revolution and Revolt,* (ප්‍රතිවිප්ලවය සහ කැරැල්ල), බොස්ටන්, බීකන් මුද්‍රනාලය, 1972, පිටු 25]

**(39)** "කියවීම, දේශනවලට සවන්දීම හා බොහෝ පැය ගනන් සාකච්ඡාවලට සහභාගී වීම" යන ආකාරයට සිය වර්ධනය කෙරෙහි ඇතිකල බලපෑම් ලබැඳියාවෙන් සිහිපත් කරන මෙම වදන්, කම්කරුවන්ට අධ්‍යාපනය දීම සඳහා සසපයේ උත්සුකයන් ස්ටයිනර් විසින් වර්තමානයේ පිලිකුල් සහගත ලෙස බැහැර කිරීම හා සැසඳිය යුතුය. "වෘත්තීය සමිතිවල ඓතිහාසික භූමිකාව පිලිබඳව කම්කරුවෙක් අවබෝධය ලබාගන්නේ කෙසේදැයි ඔහු උපහාසාත්මකව විමසයි. "අනුමාන කරන ලෙස මෙය ලැබෙනුයේ ලෝසවෙඅ කියවීමෙන් හෝ පක්ෂ දේශනවලට සවන් දීමෙනුයි.... මේ වඳ ප්‍රචාරකවාදය ට්‍රොට්ස්කිවාදයේ සම්ප්‍රදායන්ට මුලුමනින්ම ආගන්තුකය." (එම්ඩබ්ලිව්එච්එච්, 109 පිටුව) වෙනත් වචනවලින් කිවහොත්, දේශන, කියවීම හා සාකච්ඡා මුලුමනින්ම සීමාවන්නේ බුද්ධිමතුන්ට පමනි.

**(40)** මේ වකවානුව තුල ක්‍රියාත්මක කරනලද ප්‍රායෝගික කටයුතු පිලිබඳ ස්ටයිනර්ගේ විස්තරය, පක්ෂයේ කර්තව්‍යයන් හා කාර්ය සිද්ධීන් පිලිබඳ යථා වාර්තාවේ විකට රූපයකි. කම්කරු පන්තියේ වඩාත්ම සටන්කාමී කොටස් අතර වර්කර්ස් ලීගය සැලකිය යුතු නියෝජනයක් අත්කර ගත්තේ හරියටම මේ කාලය තුලයි. විශේෂයෙන්ම, ප්‍රධාන ජාතික ගල් අඟුරු වැඩවර්ජන දෙක පැවති කාලය තුල, බටහිර වර්ජිනියාවේ හා කෙන්ටකී හි ගල් අඟුරු පතල් කම්කරුවන් අතර පක්ෂය පුලුල් අනුගාමිකයන් පිරිසක් දිනා ගත්තේය. 1977-78 වසරවල දෙවන වැඩ වර්ජනය දින 100 කට අධික කාලයක් පැවතුනි. එහි කූඨප්‍රාප්තිය ජනාධිපති කාටර් විසින් කම්කරු විරෝධී ටැෆ්ට්-හාට්ලි පනතේ පිහිට පැතීමට එරෙහිව සාර්ථක ලෙස අභියෝග කිරීම විය. පක්ෂයේ කාර්මික අංශය වූ කම්කරු පක්ෂයක් සඳහා වෘත්තීය සමිති සන්ධානයේ කන්ඩායම් රට පුරා ක්‍රියාත්මක වූහ. නිව් යෝර්ක්හිදී සටන්කාමී සංක්‍රමනික කම්කරුවෙකු හා වර්කර්ස් ලීගයේ සාමාජිකයෙකු වූ එඩ් වින්, වෘත්තීය සමිතියේ විධායක මන්ඩල අසුනකට 1977 දෙසැම්බරයේදී තෝරාපත්කර ගන්නා ලදී. ඔහුගේ ව්‍යායාමය පදනම් වූයේ නිශ්චිතවම සමාජවාදී වැඩ පිලිවෙලක් මතය. ලුවිසියානාවේ දඩයම්කාරී කුමන්ත්‍රනයක ගොදුරක් වූ හැරී ටයිලර් ගේ නිදහස උදෙසා 1976 මැයි මාසයේ තරුන සමාජවාදියෝ සංවිධානය විසින් දියත් කරන ලද ව්‍යාපාරය රට පුරාම තරුන පිරිස් අතර සැලකිය යුතු සහායක් දිනා ගත්තේය. පක්ෂ සාමාජිකයන්ගෙන් අපේක්ෂා කරන ලද වගකීම සුලු පටු නොවීය. එහෙත් වර්කර්ස් ලීගය විප්ලවකාරී සමාජවාදී සංවිධානයක් වන බව අප සිහි තබාගත යුතුය.

**(41)** ටොම් හෙනහන්ගේ මරනය සිදුවූ වර්ෂය ගැන ස්ටයිනර්ගේ ව්‍යාකුලත්වය පිලිබඳ කරුන හැරුනු කොට, "එවැනි ප්‍රවෘත්තියක් ඇසීමට මා කිසිදු

සූදානමකින් පසු නොවූයෙමි" යන ඔහුගේ ප්‍රකාශය ද කෙනෙකු මවිතයට පත්කරන සුලුය. ඇත්ත වශයෙන්ම ලියෝන් ට්‍රොට්ස්කිගේ ඝාතනය පිලිබඳව පක්ෂය ගෙනගිය පරීක්ෂනය හා සමාජවාදී කම්කරු පක්ෂය තුලට දැඩිලෙස ආන්ඩුවේ ඒජන්තයන් කාවැදීම පිලිබඳ එහි හෙලිදරව් කිරීම්, වර්කර්ස් ලීගයට එරෙහි ප්‍රචන්ඩත්වයේ තර්ජන ක්‍රමයෙන් නැගී එන තත්ත්වයකට මඟ පෑදීය. හෙනහන් මරාදැමීමට පූර්ව මාස වලදී පක්ෂ සාමාජිකයන්ගේ ආරක්ෂාව පිලිබඳව වැඩිපුර අවධානයක් යොමුකිරීමේ අවශ්‍යතාවය ගැන නිරන්තරව සාකච්ඡා පැවැත්වුනි. මේ සාකච්ඡාවලට ස්ටයිනර් ද සහභාගී විය. 1977 ඔක්තෝබර් 16 වන දින හෙනහන්ගේ අභාවයෙන් පසුව, එම වෙඩි තැබීම හුදෙක් "අර්ථ විරහිත මිනීමැරුමක්" ලෙස නිව් යෝර්ක් මාධ්‍ය විසින් හඳුන්වන ලද ප්‍රකාශ වර්කර්ස් ලීගය ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කලේය. වෙඩිතැබීම දේශපාලනිකව පොලඹවන ලද ඝාතනයක් ලෙස හෙලාදුටු වර්කර්ස් ලීගය, මෙම අපරාධය පිලිබඳ පරීක්ෂනයක් සඳහා කම්කරු පන්තිය තුල පුළුල් ව්‍යාපාරයක් ගෙන ගියේය. එක්සත් ජනපදය, කැනඩාව හා අනෙකුත් රටවල දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් නියෝජනය කල සංවිධාන මේ ඉල්ලීමට සිය අනුමැතිය පලකලහ. වසර තුනක් තිස්සේ නිව් යෝර්ක් පොලිස් දෙපාර්තමේන්තුව ඝාතකයන්ට ආවරනය සැපයීය. එහෙත් ප්‍රසිද්ධ සාදයකදී හෙනහන්ට වෙඩිතැබූ පුද්ගලයන් දෙදෙනා අත්අඩංගුවට ගෙන පසුව ඔවුන්ට දඬුවම් පැමිනවීමටත් මේ ව්‍යාපාරය විසින් කොන්දේසි සැකසීය.

**(42)** තෙමසකට පසුව 1979 ජනවාරියේ, ඩෙට්රොයිට්හි සතියකටත් අඩු කාලයක් ගතකල ෆ්‍රැන්ක් බ්‍රෙනර්, කිසිදු පැහැදිලි කිරීමකින් තොරවම පක්ෂය හැර ගියේය.

**(43)** එත්තු ගැන්වීමට තවත් කරුනක් ඇත. නැවත පක්ෂයට නොබැඳී සිටීමට ඔහු ගත් තීරනය පැහැදිලි කිරීමේ දී, ස්ටයිනර් නිවැරදි ලෙස කේන්ද්‍රීය අවධාරනය යොමු කලේ ඔහුගේ පොදු දෘෂ්ටිය හැඩ ගැස්වූ සමාජ පරිසරයේ බලපෑම මතය. "සුව පහසු මධ්‍යම පන්තික ශ්‍රේනියට මම ඇතුලුවී සිටින්නෙමි. හා එය කඩාකප්පල් කර ගැනීමට මාගේ කැමැත්තක් නොතිබූ බව මම දැන සිටියෙමි." මේ අනුව, ඔහුගේම දේශපාලන විකාශනය සලකා බැලීමේදී ස්ටයිනර්, සමාජ පරිසරය හා පන්ති පීඩනයන් මත අවධාරනය යෙදීය. එනමුදු ඔහුගේ මෙම ප්‍රවේශය, දෙවැනි ජාත්‍යන්තරයේ කඩා වැටීම හා ප්ලෙකානොව් වැනි අයට අත්වූ ඉරනම පිලිබඳව සලකා බලන, *මාක්ස්වාදය හා වෛෂයිකවාදය* නමැති කෘතියත්, එම්ඩබ්ලිව්එච්එච් හි ඔහු ගන්නා ප්‍රවේශයත් සසඳ බලන්න. එහිදී ස්ටයිනර් අවධාරනය කරන්නේ, එම අයගේ දේශපාලන අසාර්ථකත්වයේ අති මූලික හේතුව රැඳී පැවතියේ අපෝහක භෞතිකවාදය පිලිබඳ ඔවුන්ගේ අප්‍රමානවත් අවබෝධය තුල බවයි. ලෙනින් හා ට්‍රොට්ස්කිගේ කෘතීන් මත පදනම්වූ මාගේ ස්ථාවරය වූයේ, දෙවැනි ජාත්‍යන්තරයේ කඩා වැටීමෙහි හා එහි බොහොමයක් නායකයන් විසින් ඉටුකල සෝචනීය භූමිකාවේ සාරභූත හේතුව සොයාගත හැක්කේ, ඔවුන් ජීවත්වූ යුගයේ සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රතිගතිතා තුල බවය. (මේ ප්‍රතිවිරෝධයන් බොහෝ දුරකට ඔවුන්ගේ න්‍යායික කර්තව්‍යයන්හි නිශ්චිත ගති ලක්ෂන තීරනය කලේය.) මගේ මේ ස්ථාවරය "වෛෂයිකවාදය" ලෙස ස්ටයිනර්ගේ හෙලා දැකීමට ලක්වෙයි.

**(44)** මේ අනුව මම ස්ටයිනර් ඉදිරියේම, දෙවන ජාත්‍යන්තරයේ න්‍යායික පරිහානිය, වෛෂයික සමාජ හා දේශපාලන තත්ත්වයන්ට සම්බන්ධ කලෙමි. එවේලේ ඔහු ඊට විරෝධයක් පෑවේ නැත.

**(45)** *මාක්ස්වාදය ද වෛෂයිකවාදය ද* කෘතියෙහි හෝ එම්ඩබ්ලිව්එච්එච් හි, 2000 පෙබරවාරි රැස්වීමට ස්ටයිනර් පුද්ගලිකවම සහභාගී වීම පිලිගැනීම පසෙක තිබියදී, ස්ටයිනර්/බ්‍රෙනර් එම රැස්වීම ගැන සඳහනක්වත් නොකරති.

**(46)** ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ නියෝජිතයන් විසින් දරන ලද ප්‍රතිගාමී දේශපාලන ස්ථාවරයන්, ඔවුන්ගේ න්‍යායික කෘතීන් පිලිබඳ අපගේ අගැයීම කෙරෙහි බල නොපෑ යුතු බව ස්ටයිනර් පසුව ප්‍රකාශ කලේය. හයිඩෙගර් වෙනුවෙන් ඉදිරිපත් කරන එවැනිම ක්ෂමාලාපවලට පිලිතුරු වශයෙන්, ඔහුගේ පිලිතුර සමාලෝචනය කරමින් ලොසවෙඅ පලකල ලිපියට අවධානය යොමුකිරීම වටින්නේය.

විශේෂයෙන්ම යමෙකුට, දේශපාලන හා සමාජ විද්‍යාත්මක උත්සුකයන්ගෙන් ඈත්වූ, එකිනෙකට අසම්බන්ධවූ න්‍යායික කටයුතුවල දිගටම යෙදී සිටිය හැකි යයි යමෙකු පිලිගත් අවස්ථාවන්හිදී පවා, කිසියම් න්‍යායාචාර්යවරයෙකුගේ කටයුතු තුල ද්විධාකරනයක් පැවැත්තේ යයි නිගමනය කල නොහැක. හයිඩෙගර්ගේ න්‍යායික සූත්‍රගතකිරීම්, ඔහුගේ පුද්ගලික හා දේශපාලන කටයුතු සමග සමීපව ලෙස එකට බැඳී තිබුන බව දැනසිටියදී පවා, එවැනි පුද්ගලයෙකුගේ දේශපාලන කටයුතු හා න්‍යායික සූත්‍රගත කිරීම් අතර දෙබිඩි ස්වභාවයක් තිබෙනු ඇතැයි පැවසීම මවිතකරවන සුලුය.

විශේෂයෙන්ම, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ නියෝජිතයන් දේශපාලනයේ නිරතවූ න්‍යායාචාර්යවරුන් බව සලකා බලන විට මෙම වදන් මවිතකරවන සුලුය.

© www.wsws.org